වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT 2018

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
மில்கோ (தனி) நிறுவனம்
Mllco (Pvt) Ltd



අන්තර්ගතය

ආයතනික තොරතුරු	1
සභාපතිතුමාගේ පණිවිඩය	2
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	3 - 5
සංස්ථාමය පාලනය	6
විගණකවරුන්ගේ වාර්තාව	7 - 15
ශේෂ පත්‍රය	16
ආදායම් ප්‍රකාශය	17
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය	18
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	19 - 20
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	21 - 56
විශේෂ මූල්‍ය සිදුවීම්	57

DSSPI - Tel: 2847042 / 2849600 Fax: 2851348

සංස්ථානික තොරතුරු

සමාගමේ නම	-	මිල්කෝ (පුද්ගලික) සමාගම
නෛතික තත්ත්වය	-	1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සීමාසහිත පුද්ගලික සමාගමකි
ලියාපදිංචි කාර්යාලය	-	අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05
	-	දුරකථන: 0112586174, 0114500541
	-	ෆැක්ස්: 0112368082/ 0112577540/0114500555
	-	වෙබ් අඩවිය: www.milco.lk
	-	විද්‍යුත් තැපෑල: info@milco.lk
කර්මාන්ත ශාලා	-	කොළඹ කිරි කර්මාන්ත ශාලාව
	-	අඹේවෙල විසිරි වියළි කිරි කර්මාන්ත ශාලාව
	-	දිගන කිරි කර්මාන්ත ශාලාව
	-	පොලොන්නරුව උකු කිරි කර්මාන්ත ශාලාව
සංස්ථාගත කළ දිනය	-	1996 මැයි 09
නැවත ලියාපදිංචි කළ දිනය	-	2008 මැයි 19
සමාගම් ලියාපදිංචි අංකය	-	N (PVS) 17159 (පැරණි)
	-	PV 2942 (නව)
සමාගමේ ලේකම්වරු	-	ෆයිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් ඒජන්සීස් (පුද්) සමාගම අංක 300/3, නාවල පාර, නාවල

අධ්‍යක්ෂවරු	-	ඒ. එම්. ඉසෙඩ්. කාදර්	- සභාපති
	-	නිහාල් එදිරසිංහ	- ක්‍රියාකාරී අධ්‍යක්ෂ
	-	බියන්කා එන්. ගමගේ	- අධ්‍යක්ෂ
	-	ඩී. ජී. සුමිත් වික්ක්‍රම	- අධ්‍යක්ෂ
	-	එම්. ජනක දේශප්‍රිය	- අධ්‍යක්ෂ
	-	ඒ. එම්. ටී. අත්තනායක	- අධ්‍යක්ෂ
	-	කේ. සරත් චමින්ද	- අධ්‍යක්ෂ
	-	සී. එන්. එස්. ගමගේ	- අධ්‍යක්ෂ

විගණකවරු	-	අභ්‍යන්තර අර්න්ස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම 201, ද සේරම් පෙදෙස, කොළඹ 10
	-	බාහිර රජයේ විගණනය විගණකාධිපති
බැංකුකරුවෝ	-	මහජන බැංකුව
	-	ලංකා බැංකුව

සභාපතිතුමාගේ පණිවුඩය

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, රජය සතු ව්‍යාපාරයක් වශයෙන් වසර 66 ක පමණ කාලයක් තුල හයිලන්ඩ් වෙළඳනාමය යටතේ ඉතා ප්‍රශස්ත මට්ටමක කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපලට ලබා දෙමින් අති විශාල කාර්යභාරයක් ඉටුකර ඇත.

කොළඹ නාරාහේන්පිට, අඹේවෙළ, පොළොන්නරුව හා දිගන පිහිටි කර්මාන්තශාලා හතරකින් දෛනිකව රටේ ජනතාවගේ අවශ්‍යතා හඳුනා ගනිමින් වෙළඳපොලතුල කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රධාන සැපයුම්කරු වීමට හැකි වීමෙන් අප ආයතනය ලබා ඇති ගෞරවය සමස්ථ සේවක ජයග්‍රහනයක් ලෙස සටහන් කරනු ලබන්නේ ආඩම්බරයෙනි.

තරගකාරී වෙළඳපල තුල ග්‍රාමීය කිරි ගොවීන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කරමින් පාරිභෝගිකයාටද ඉතාම උසස් තත්ත්වයේ ගුණාත්මක කිරි ආශ්‍රිත නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට අප ආයතනයට හැකියාව ලැබී ඇත.

රජය මගින් කිරි නිෂ්පාදන ඉහල නැංවීම සඳහා පසුගිය වසර ගණනාවක් තුලදී ගන්නා ලද පියවරයන් නිසා ග්‍රාමීය කිරි ගොවීන්ගේ කිරි නිෂ්පාදන ඉහල යාමට පිළියමක් ලෙස ආයතනයේ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කරමින් කර්මාන්තශාලා නවීකරණ කටයුතු ආරම්භ කරන ලද අතර අඹේවෙළ කර්මාන්තශාලාව සඳහා යුරෝ මිලියන 26.6 ක් පමණ වැයකොට නව කිරි පිටි නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කරන ලදී. මේ මගින් දෛනිකව කිරි පිටි කිලෝ 30,000 ක් පමණ වෙළඳ පොළට නිකුත් කිරීමට අප ආයතනයට හැකියාව ලැබී ඇත. එමෙන් ම, බඩල්ගම නව කිරි කර්මාන්තශාලාව ඉදිකිරීමේ කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පවතී. 2018 වසර තුල බඩල්ගම කර්මාන්තශාලවට රුපියල් මිලියන 2353 ක් පමණ වටිනා යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලැබී ඇත.

ශ්‍රී ලංකාව තුළ හොඳම තත්ත්වයේ පෝෂණීය කිරි ආශ්‍රිත ආහාර පාන ලබා දෙන සමාගම වීම අප ආයනයේ දැක්මයි. ඒ අනුව ග්‍රාමීය කිරි ගොවියා ශක්තිමත් කරමින් කිරි නිෂ්පාදනය ඉහල නංවා ගැනීමත්, ඒ තුලින් වෙළඳපොල අවශ්‍යතාවයට හා ඉල්ලුමට සරිලන පරිදි ආයතනයේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නංවා ගැනීමත් අපගේ අරමුණයි. මෙම අරමුණ කරා යන ගමනේදී හමුවන විවිධ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ආයතනයේ සියළුම සේවක මණ්ඩලයට ධෛර්යය හා ශක්තිය ලැබෙවායි මා ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම, මෙතෙක් දුර ආ ගමනේදී ආයතනයේ සාර්ථකත්වය වෙනුවෙන් කැපවූ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරුන්ට හා නිලධාරී මණ්ඩලයටත්, කලමනාකාරීත්වයට අවශ්‍ය සහයෝගය ලබා දෙමින් මග පෙන්වීමකල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටත්, සෑම අවස්ථාවකම ආයතනයේ සුබසිද්ධිය වෙනුවෙන් කැපවන කලමනාකාරීත්වය ඇතුළු සේවක මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේදී පුදකර සිටිමි.

හයිලන්ඩ් නාමය, ශ්‍රී ලංකාව තුල ප්‍රමුඛතම කිරි ආහාර නිෂ්පාදන සන්නාමය ලෙස කිරුළු පලඳන්නට මිල්කෝ ආයතනයට හැකිවේවායි මා ප්‍රාර්ථනා කර සිටිමි

රේණුක පෙරේරා
සභාපති
2022-10-12

මිල්කෝ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරුන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

ප්‍රධාන කටයුත්ත

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නැවුම් කිරි එකතු කිරීම, සැකසීම, ඇසුරුම් කිරීම, බෙදා හැරීම සහ කිරි නිෂ්පාදන අලෙවිකරණය කිරීමයි.

දේපළ පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණවලට වසර තුලදී සිදු කරන ලද එකතු කිරීම්වල අගය රු.මි.102.4කි.

අධ්‍යක්ෂ මණ්ඩලය

2018.01.01 සිට පහත අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක විය

කේ.පී.පී.එච්. මිහිරිපැන්න - සභාපති
ටියුඩර් එස්. අමරසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
බියංකා ගමගේ මෙය -අධ්‍යක්ෂ -(භාණ්ඩාගාර නියෝජිත)
ජේ.ඒ.එස්.ජයකොඩි මහතා - අධ්‍යක්ෂ
බී.ඩී.එම්. චන්දිමා - අධ්‍යක්ෂ
එම්.එච්.එම්.ෆසාල් - අධ්‍යක්ෂ

මණ්ඩලයට අදාළව පහත පත්වීම්/අස්වීම් පහත ආකාරයෙන් ක්‍රියාත්මක විය.

2018.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එස්.ඒ.ඩී.එස්.එල්. වීරසිංහ මයා පත් කරන ලදී.
2018.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්. මනිමුත්තු මයා පත් කරන ලදී.
එන්.ඒ.පී.සී. නාපාගොඩ මයා 2018.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද අතර 2018.05. 21 දින ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.
කේ.පී. පී. එච්. මිහිරිපැන්න මයා 2018.05.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
ටියුඩර් එස්. අමරසිංහ මයා 2018.05.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
ඉංජිනේරු ඒ.එම්.ඉසෙඩ්. කාදර් මයා 2018 05.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාපති ලෙස පත් කරන ලදී.
නිහාල් එදිරිසිංහ මහතා 2018.05.31 දින සිට දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
ජේ.ඒ.එස් ජයකොඩි මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
එම්.එච්.එම්.ෆසාල් මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
බී.ඩී.එම්. චන්දිම මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
ඩී.ජී.එස්. වික්‍රම මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
ඉංජිනේරු ජානක දේශප්‍රිය මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

ඒ.එම්.ටී අත්තනායක මයා 2018.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
සරත් වමින්ද මයා 2018.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී..
ආචාර්ය සී.එන්.එස්. ගමගේ රේඛීය අමාත්‍යාංශයේ නියෝජිත ලෙස 2018.10.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

මේ වන විට සිටින අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

රේණුක පෙරේරා මයා 2022.01.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාපති ලෙස පත් කරන ලදී.
ඩබ්.ඩී.ආර් ක්‍රිෂාන්ත මයා 2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් කරන ලදී.
එච්.එම්.එම්. හේරත් මයා 2021.01.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
කැලුම් ගුණතිලක මයා 2021.07.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
අරුණ ප්‍රසන්න මයා 2021.01.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
උෂාන් අබේවික්‍රම මයා 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
ආචාර්ය ප්‍රසන්න මෙන්ඩිස් 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
එච්.ඒ. අමරසේන මයා 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

කොටස් තොරතුරු

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සමාලෝචිත වසරේදී වටිනාකම රු.මිලියන 319.4 ක් විය

සංචිත

ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභය වන රු. 785,181,360 /= විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති වත්මන් වසරේ පාඩුව වන බදුවලින් පසු රු.481,785,860/= ට ගලපා ඇත.

වසර අවසානයේ සංචිතයට රු.25,000,000/= ක ප්‍රාග්ධන සංචිතය සහ රු.1,689,978/= නිදන් අරමුදල් අයත් වේ.

අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම්ගත සම්බන්ධතා

අධ්‍යක්ෂවරු සෘජුව හෝ වක්‍රව සමාගමේ කිසිදු ගිවිසුමකට සම්බන්ධ වී නැත.

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් ආයතනික පාලනයක් සහතික කරයි. සමාගමේ අරමුණු මෙන්ම පාර්ශවකරුවන්ගේ අරමුණු හා අපේක්ෂාවන්ට අනුකූලව කාර්ය සාධනය සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකමකි.

බදුකරණය

පොලී ආදායම සහ විලම්භිත බද්දෙන් පැන නගින ආදායම් බදු වගකීම රුපියල් 201,663,631/= මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ලාභය නිදහස් කර ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව හා නියමිත වේලාවට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමෙන් හා විශ්වාසයෙන් උපරිම ලෙස සැහීමකට පත්වේ.

අනුකූලතාව

සමාගම ශ්‍රී ලංකාවට හෝ වෙනත් තැනකට අදාළ වන නීති හෝ රෙගුලාසිවලට පටහැනි ක්‍රියාකාරකම්වල නිරත වී නොමැත.

අඛණ්ඩ පැවැත්ම

ඉදිරි අනාගතයේ දී සිය මෙහෙයුම් දිගටම කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මෙය සැලකිල්ලට ගනිමින්, සමාගමේ ගිණුම් සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අපි දිගටම ක්‍රියාත්මක කරමු.

විගණකවරුන් පත් කිරීම

2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකවරුන් ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණකාධිපතිවරයා පත් කරන ලදී. අධ්‍යක්ෂවරුන් දන්නා පරිදි, විගණකවරුන්ට ඔවුන්ගේ ස්වාධීනත්වයට බලපෑමක් ඇති කරන අයුරින් සමාගම හෝ එහි පරිපාලිත සමාගම් සමග කිසිදු සම්බන්ධයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

.....

සමාගම් ලේකම්
ෆයිනැන්ෂල් සර්විසස් ඇන්ඩ් කමර්ෂල් ඒජන්සීස් පුද්ගලික සමාගම
/SEC(555/ 91) අංක 300/3, නාවල පාර, නාවල

සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට එක් වරක් පදනමින් වාරික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදී. මූල්‍ය පාලනය සහතික කිරීමේදී සහ පවත්වා ගැනීමේදී සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය ප්‍රධාන සාධන පත්‍ර වූ අතර මූල්‍ය වර්ෂය ආරම්භයේදී සියලු රේඛීය කළමනාකරුවන් විමසා ඒවා පිළියෙල කරනු ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය.

මාසික කාර්ය සාධන වාර්තා පෙර මාසයේ වාර්තා සමග සංසන්දනය කරනු ලබන අතර තදනන්තර මාසික රැස්වීම්වලදී අයවැය නිතිපතා සහාගත කරන ලදී. මෙම වාර්තාව ඉලක්ක සහිතව මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ කාලීන වාර්තා සපයන අතර සමාගමේ ලාභය සහ අලාභය සම්බන්ධයෙන් සඵල කළමනාකරණ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලබා දෙයි.

විගණන කමිටුව

භාණ්ඩාගාරය නියෝජනය කරන්නා වූ අධ්‍යක්ෂවරයා විගණන කමිටුවේ මුලසුන දැරිය යුතු අතර කමිටුව තවත් විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සහිතව ක්‍රියාත්මක වූ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස කටයුතු කරන අතර වඩා ඉහළ ස්වාධීනත්වයක් සහතික කිරීම බාහිර ආයතනයකට පිරිනමා ඇති අභ්‍යන්තර විගණනය විසින් එයට සේවය සපයන ලදී.

අර්න්ස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම වර්ෂය තුළදී අභ්‍යන්තර විගණකවරුන් ලෙස කටයුතු කරන ලදී. එම ආයතනය ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල, පොලොන්නරුව හා දිගන යන කර්මාන්තශාලා වල ශාඛා කාර්යාල පවත්වාගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණකවරුන් විසින් පිළියෙල කරනු ලබන විගණන සැලැස්මක් වර්ෂය ආරම්භයේදී විගණන කමිටුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර මෙම සැලැස්ම ප්‍රකාරව වසර පුරාම අභ්‍යන්තර විගණන විමසුම් හා පරීක්ෂාවන් සිදුකරනු ලබයි. විගණන අනාවරණයන් පිළිබඳ විස්තරාත්මක වාර්තා පළමුව අදහස් සහ ප්‍රතිචාර සඳහා අදාළ කළමනාකරුවන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කරනු ලැබේ. මෙම අදහස් මත පදනම්ව, සාරාංශ වාර්තාවක් සකස් කොට විගණන කමිටුවේ සමාලෝචනය සහ පසු විපරම් ක්‍රියා මාර්ග සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුව මසකට වරක් රැස්වේ.

ආයතනික කළමනාකරණය

තම කොටස්කරුවන්ට සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව සමාගමේ මූල්‍ය තත්ත්වය නියෝජනය වන පරිදි නිසි විගණන වාර්තා සමාගම පවත්වා ගන්නා බවට අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගනී. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ සහ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන බවට සහ ඉදිරිපත් කරනු ලබන බවට ඔවුන් සහතික වෙයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

සභාපති

මිල්කො පෞද්ගලික සමාගම

මිල්කො පෞද්ගලික සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාචනය

මිල්කෝ පෞද්ගලික සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලභා ගැනීමට මා හට නොහැකි විය.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය ප්‍රකාරව ඉඩදී ඇති අවස්ථාවලදී හැර වත්කම් වගකීම් හා ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් නොකළ යුතු වුවද, සමාගම විසින් රු. 31,437,088 ක් වූ බැර ශේෂ වෙළඳ ණයගැති හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන්ට හිලව් කර ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) පිරිවැය රු. 172,639,245 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ දේපළ පිරියත හා උපකරන තවදුරටත් සමාගම විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 16 ඡේද 50 හා 51 ඡේද ප්‍රකාරව අදාල වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්වල අවශ්‍ය කරන ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය. කිරීමේදී ලාභය රු. 80,551,142 ක් ලෙස සලකා සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කර තිබුණද, විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව ලාභය රු. 69,273,982 ක් වුයෙන් සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය සඳහා ලාභය රු. 11,277,160 ක් වැඩිපුර සලකා ගණනය කිරීම් කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 ප්‍රකාරව කිසියම් ගෙවීමක් සිදුකරනු ලබන දිනයේ පැවති විදේශ විනිමය අනුපාතය අනුව ගණුදෙනු සටහන් කල යුතු වුවත් සමාගම විසින් එසේ කිරීමකින් තොරව වර්ෂ අවසාන විනිමය අනුපාතය අනුව බඩල්ගම නව කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් හා අදාල යන්ත්‍ර උපකරණ අමතර කොටස් ගෙන්වීම් වෙනුවෙන් 2018 වර්ෂයට අදාල අත්තිකාරම් මුදලෙන් රු. 748,015,807 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට මාරුකර තිබුණි. ඒ අනුව බැර කල යුතු අත්තිකාරම් මුදල රු. 576,287,497 ක් වූ බැවින් රු. 171,728,310 ක් වැඩියෙන් කෙරීගෙන යන වැඩ ගිණුමට බැර කර තිබුණි.

(ඉ) 2013 ජනවාරි 17 දින රු. 15,445,587 ක් වැය කර අයිස් ක්‍රීම් කෝන් පිරවුම් යන්ත්‍රයක් ප්‍රධාන කාර්යාලය මිලදී ගෙන 2014 අප්‍රේල් මස දිගන පිහිටි කිරි කර්මාන්තශාලාව වෙත භාරදී ඇති අතර එය විගණිත දිනය වන 2021 නොවැම්බර් 16 දින වන විටත් භාවිතයට ගත නොහැකිව නිෂ්ක්‍රීයව පැවතියද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද අංක 12 (ඊ) පරිදි හානිකරණ ගැලපීම් සිදුකර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි.

(ඊ) කොළඹ කර්මාන්තශාලාවේ සවි කිරීම සඳහා 2011 ජනවාරි 20 දින කල් බදු පදනමට මිලදීගත් රු. 104,177,779 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් 2013 අගෝස්තු 30 දින පොළොන්නරුව කර්මාන්තශාලාවේ සවිකර තිබුණු අතර මෙම යන්ත්‍රයේ පැවති තාක්ෂණික දෝෂ හේතුවෙන් එය මිලදී ගත් දින සිට විගණිත දිනය වූ 2021 නොවැම්බර් 16 දින වන විටත් භාවිතයට ගත නොහැකිව නිෂ්ක්‍රීයව පැවතියද, එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 යේ ඡේද අංක 12 (ඊ) පරිදි හානිකරණ ගැලපීම් සිදුකර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි,

(උ) සමාගමේ කළමනාකරණ හා කාර්යසාධන වාර්තා අනුව නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර ඇති අඹේවෙල කර්මාන්තශාලාවට 2018 හා 2019 වර්ෂවලදි දියර කිරි ලැබී තිබුණේ යන්ත්‍ර ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 26 කට හා සියයට 25 කට ප්‍රමාණවත් දියරකිරි පමණි. වර්තමානයේ ඉදිවෙමින් පවතින බඩල්ගම කර්මාන්තශාලාව නිම වීමෙන් පසු අදාළ කර්මාන්තශාලාවේ යන්ත්‍ර ධාරිතාවය අනුව දිනකට සමාගමට දියර කිරි ලීටර් 600,000 ක් අවශ්‍ය බවට වාර්තා කර ඇතත් වර්තමානයේ ආයනනයට එකතු කළ හැකි දෛනික දියර කිරි ප්‍රමාණය ලීටර් 200,000 ක් පමණ වන බැවින් මෙම යන්ත්‍ර සම්පූර්ණ ධාරිතාවයෙන්. ශාවිතා නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු.10,957,945,499 ක් වැය කරන ලද යන්ත්‍ර සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද අංක 12 (ඊ) පරිදි හානිකරණ ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 ප්‍රකාරව ණය හා වෙනත් ලැබිය යුතු දෑ අගය කිරීමේදී භායන පිරිවැය (Amortized Cost) ඵලදායී පොලී අනුපාතය ශාවිතයෙන් අගය කළ යුතුය. එසේ නමුත් සමාගම විසින් ඒ අනුව කටයුතු නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු ලබන රු. 1,288,433,433 ක ණය හා වෙනත් ලැබිය යුතු ශේෂය නිවැරදි අගයට ගිණුම්ගත වී ඇති බවට විගණනයට සෑහීමකට පත්විය නොහැක.

(එ) බඩල්ගම කිරි කර්මාන්ත ශාලාව ඉදිකිරීම් වෙනුවෙන් ලහා දී තිබූ අත්තිකාරම් මුදලින් සමාලෝචිත වසරේ ඉතිරිව ඇති ආරම්භක ශේෂය යුරෝ 5,192,173.12 ක් වූ අතර එය සමාලෝචිත වසරේ ආරම්භක විනිමය අනුපාතයට අනුව ගණනය කල විට රු. 934,383,475 ක් විය. නමුත් එම ආරම්භක ශේෂය රු. 560,536,942 ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දිගුකාලින අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වසරේ විදේශ විනිමය අනුපාතය වෙනස් වීමේ බලපෑම රු. 373,846,533 අධිගණනය වීම නිසා දිගුකාලීන අත්තිකාරම් ගිණුම සහ රජයට ගෙවිය යුතු ණය ශේෂය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඒ) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණයන්ට අදාල වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු. 493,952,107 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන අංක 3 අනුව වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු. 542.428,556 ක් වූයෙන් අදාල ශේෂයන් දෙක අතර රු. 3,175,911 ක වෙනසක් විය,

(ඔ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන අංක 3 අනුව 2018 දෙසැම්බර් 31 දිනට දේපල පිරියන උපකරණ ශේෂය රු. 9,143,350,785 ක් වුවද උපලේඛනය අනුව එදිනට දේපල පිරියත උපකරණ ශේෂය රු. 9,140,150,838 ක් වූයෙන් ශේෂයන් දෙක අතර රු. 3,199,946 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන අංක 3 අනුව 2018 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත උපකරණ සමුච්චිත ක්ෂය රු. 2,691,849,950 ක් වුවද උපලේඛනය අනුව එම ශේෂය රු. 2,688,650,004 ක් වූයෙන් ශේෂයන් දෙක අතර රු. 3,199,946 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ක) සමාගම විසින් විවිධ කාර්යයන් සඳහා සේවක අත්තිකාරම් ලෙස ලහා දී තිබූ වසර 10 ක් ඉක්මවූ රු. 11,307,636 ක් වූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඉතිරි අත්තිකාරම් ශේෂය තුළ 2012 හා 2014 වර්ෂයන්හිදී ඉදිකිරීම් වෙනුවෙන් ගෙවන ලද රු. 384,275 ක් හා රු. 3,498,375 ක් වූ අත්තිකාරම්ද නිරවුල් කර නොතිබුණි.

(කා) මූල්‍ය ප්‍රකාශයන්හි අත්තිකාරම්, තැම්පතු හා කලින් ගෙවීම් ශේෂය තුල ඇතුලත් වාහන විකුණුම් වෙනුවෙන් ලද රු. 100,000 ක් හා රු. 821,564 ක ශේෂ, බැර කර දක්වා තිබුණි.

(කැ) 2018 දෙසැම්බර් 31 දිනට උපලේඛනය අනුව පෙර ගෙවීම් ශේෂය රු. 25,500,823 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම් ශේෂය තුළ ඇතුළත් වටිනාකම රු. 18,847,532 ක් වූයෙන් ශේෂයන් අතර රු. 6,653,291 ක වෙනසක් විය.

(කෑ) අඹේවෙල කර්මාන්තශාලා මූල්‍ය ප්‍රකාශනයන්හි වෙළඳ ණයගැති ශේෂය රු. 138,211,444 ක් වුවද උපලේඛනය අනුව ශේෂය රු. 137,441,575 ක් වූයෙන් ශේෂයන් අතර රු. 769,869 ක වෙනසක් විය.

(කි) පොලොන්නරුව කර්මාන්තශාලාවේ ණයගැති වයස් විශ්ලේෂණය අනුව ශේෂය රු. 83,633,046 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ශේෂය රු. 83,232,275 ක් වූයෙන් ශේෂයන් අතර රු. 400,771 ක වෙනසක් විය.

(කී) මූල්‍ය ප්‍රකාශන අනුව දළ ආදායම රු. 11,849,851,230 ක් වුවද ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව ආදායම රු, 11,760,545,396 ක් වුයෙන් ශේෂයන් අතර රු. 89,305,833 ක වෙනසක් විය.

(කු) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 16 අනුව සමාලොචිත වර්ෂයේ සේවක ප්‍රතිලාභ බැදීම් වගකීම ගණනය කිරීමෙදි වර්ථමාන සේවා පිරිවැය සහ පොලි පිරිවැයෙහි ඒකතුව රු. 87,046,552 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් පිරිවැය හා සේවක වියදම් යටතේ දක්වා ඇති ඒම පිරිවැයෙහි ඒකතුව රු. 81,454,572 ක් වුයෙන් රු. 5,591,980 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කූ) ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් ආදායම් තුළ රු. 18,558,260 ක් වූ සෘණ ශේෂයන් පැවති අතර ඒ අනුව අනෙකුත් ආදායම එම වටිනාකමින් ඍණ ගණනය වී තිබුණි.

(කෙ) ඇමරිකන් ඩොලර් ස්ථාවර තැන්පතුවෙහි කාලපරිච්ඡේදය 2018 ජූලි 06 දින සිට 2019 ජූලි 06 වන බැවින් 2018 දෙසැම්බර් 31 දිනට අදාල පොළිය ලැබියයුතු ස්ථාවර තැන්පතු පොළී ලෙස ගිණුම්ගත කල යුතු වුවත් සමාගම විසින් රු. 10,902,220 ක් ස්ථාවර තැන්පතුවට ප්‍රාග්ධනිත කර තිබුණි. තවද එහි රඳවාගැනීමේ බදු වටිනාකම වන රු. 527,115 ක් බැවින් ස්ථාවර තැන්පතුව රු. 10,902,220 කින් අධිගණනය වීමත්, ලැබියයුතු ස්ථාවර තැන්පතු පොළී හා ලැබිය යුතු රඳවාගැනීමේ බදු පිළිවෙලින් රු. 10,357,105 කින් හා රු. 527,115 කින් ඍණ ගණනය වී තිබුණි.

(කේ) 2019 ජනවාරි 01 සිට පෙබරවාරි 07 දක්වා ස්ථාවර තැන්පතුවට අදාල පොළී ආදායම වන රු. 1,754,669 මුදලක් සමාලෝචන වර්ෂයේ පොලි අදායමට ඇතුලත් වී තිවූ බැවින් එම ප්‍රමාණයෙන් පොළී ආදායම අධි ගණනය වී තිබුණි.

(කො) ගෙවියයුතු ගිණුම් වල රු, 8,745,377 ක වටිනාකමක් වූ සෘණ බදු ශේෂය ගෙවියයුතු ගිණුමින් අඩුකර තිබුණි.

(කෝ) මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් ජාතිය ගොඩනැගීමේ බදු ශේෂය සමඟ එක් එක් කර්මාන්තශාලා ගිණුම්හි සඳහන් බදු ශේෂය සැසඳීමේදී කොළඹ කිරි කර්මාන්නශාලාව, අඹේවෙල කිරි කර්මාන්තශාලාව සහ පොළොන්නරුව කිරි කර්මාන්තශාලා ගිණුම්වල එකතුව රු. 577,307 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ග) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් අංක 14 හි විලම්හිත බදු වත්කම් ලෙස රු. 188,811,584 ක් දක්වා ඇති අතර එය ගණනය කිරීමේදී තොග වෙන්කිරීම් වලට අදාල විලම්හිත බදු බලපෑම වන රු. 1,693,491 ක් නොගැනීම නිසා විලම්හිත බදු වත්කම එම ප්‍රමාණයෙන්ම ඍණගණනය වී ඇත.

(ගා) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය අලෙවිසැල්හි අවසාන නිෂ්පාදන තොග ටිනාකම රු. 39,174,887 ක් හා සමාගමේ ඒකාබද්ධ නිෂ්පාදන ගිණුම අනුව ප්‍රාදේශීය අලෙවිසැල් අවසාන නිෂ්පාදන තොග වටිනාකම රු. 37,989,723 ක් විය. ඒ අනුව ඒකාබද්ධ උපලේඛනයේ හා නිෂ්පාදන ගිණුමේ ගලපා ඇති ප්‍රාදේශීය අලෙවිසැල් අවසාන නිෂ්පාදන තොග වටිනාකම් අතර රු. 1,185,164 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ගැ) රු. 6,373,221 ක අවසාන නිෂ්පාදන තොග වටිනාකම් අඩුවෙන් ගැලපීම නිසා සමාගමේ නිෂ්පාදන ගිණුමේ විකුණුම් පිරිවැය රු. 6,373,221 කින් වැඩියෙන් ද ලාභය රු. 6,373,221 කින් අඩුවෙන් ද පෙන්වන බව නිරීක්ෂණය විය.

(ඈ) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ සමාලෝචිත වර්ෂයේ ඇසුරුම් ද්‍රව්‍ය අවසන් තොගය තුල රු. 11,137,515 ක වටිනාකමකින් යුතු භාවිතා කල නොහැකි ඇසුරුම් ද්‍රව්‍ය තොගය පවතින බව නිරීක්ෂණයවූ වු අතර ඒ අනුව ලාභය හා අවසන් තොග ඒම අගයෙන් අඩි ගණනය වේ,

(ගි) කොළඹ කිරි කර්මාන්තනශාලාවේ නිකුත් නොවන තොග උපලේඛනය අනුව අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය අතිරික්ත තොග වටිනාකම් පිළිවෙලින් රු. 19,439 හා රු. 6,073,274 ක්වූ අතර ඒ අනුව ලාභය හා අවසන් තොග එම ප්‍රමාණවලින් අධිගණනය වී තිබුණි.

(ගී) කොළඹ කිරී කර්මාන්තශාලාවේ සමාගමේ ආදායම් ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව විකිණීම් හා බෙදාහැරීම වියදම් යටතේ තොග කපා හැරීම් ශා නිදහස් කිරීම් රු.23,622,7 18 ක් වන නමුත් විගණනයට ලභාදුන් තොග කපා හැරීම් හා නිදහස් කිරීම් උපලේඛනය අනුව වර්ෂයේ තොග කපා හැරීම් හා නිදහස් කිරීම් රු. 24,099,106 ක් විය. ඒ අනුව රු. 476,388 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ගු) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ඇසුරුම් ද්‍රව්‍ය තොගයේ වටිනාකම සමාගමේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ උපලේඛනය අනුව රු. 25,404,5114 ක් වුන නමුත් තොග සත්‍යපන වර්තා අනුව රු. 20,137,901 ක් වන බැවින් රු. 733,447 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ගූ) සමාගමේ වසර 5 කට වැඩියෙන් පවතින වෙළෙඳ ණයහිමියන්ගේ හර ශේෂ එකතුව රු. 4,142,872 ක් හා එකතුව රු. 12,564,281 වු වියදම් ණයගිමියන්ගේ හර ශේෂය ණයගිමි බැර ශේෂයන්ට හිලවි කර තිබුණි.

(ගෙ) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 15.1.3. යටතේ ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් ණයෙහි ආරම්භක ශේෂය ලෙස රු. 15,781,118,709 ක් දක්වා තිබුණද උපලේඛනයට අනුව කර්මාන්නශාලා නවීකරණ ව්‍යාපෘතිය හා බඩල්ගම ව්‍යාපෘතිය සඳහා ලබා තිබූ ණය ශේෂය රු. 15,780,863,322 ක් විය. සමාලෝචිත වර්ෂයේ ලද ණය මුදල රු. 2,140,219,033 ක් වුවද සටහන් අංක 15.1.3. යටතේ ඒම මුදල රු. 2,139,963,647 ක් විය. ඒ අනුව ආරම්භක ශේෂය තුළ පැවති රු. 255,386 ක වෙනස හදුනා ගැනීමෙන් තොරව ලද මුදලේ වෙනසට හිලවි කර තිබුණි.

(ගේ) කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා සමාගම හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගෙන තිබු ගිවිසුමේ 2.04 ඡේදය අනුව ව්‍යාපෘතිය සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව විසින් දරන සියලු වියදම්, එනම් විනිමය විචලනයද සමාගම විසින් දැරිය යුතු විය. ඒ අනුව ඉහත ව්‍යාපෘතියට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 23 ඡේදය ප්‍රකාරව වර්ෂය අවසානයේ විදේශ විනිමය අනුපාතයට අගය කර ගිණුම්ගතකල යුතුය. මේ අනුව 2013 සිට 2018 වූර්ෂය දක්වා ගිණුම් ගත කළ යුතු විදේශ විනිමය අනුපාන විචලනයේ අහිතකර බලපෑම වන රු. 1,339,422,864 ක් ගිණුම් ගත කර නොමැති බැවින් එම වටිනාකමට සමාන ප්‍රමාණයකින් සමාගමෙහි වගකීම අවගණනය වී සමුච්චිත ලාභය අධිගණනය වී තිබුණි.

(ගෙ) 2018 දෙසැම්බර් 31 දිනට කිරි කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය හා බඩල්ගම ව්‍යාපෘතිය යන ණය වැඩසටහන් 02 හි ණය ශේෂයන් භාණ්ඩාගාරයේ 814 වාර්තාව ට අනුව පිළි වෙලින් 5,685,332,903 හා 9,419,337,943 වු අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශණ වලට අනුව කිරි කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය හා බඩල්ගම ව්‍යාපෘතිය ණය ශේෂයන් පිළිවෙලින් 6,632,493,444 හා 11,288,333,525 විය. ඒ අනුව පිළිවෙලින් රු. 947,160,541 ක හා රු. 1,868,995,557 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ගෝ) භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 814 - 1 (V2) වාර්තාව ට අනුව කිරි කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති ණය මුදලින් භාවිත නොකරන ලද ණය ශේෂය මත අයකරන ලද බැඳීම් මුදල (commitment charges) රු. 56,821,121 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ඇ) මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයට අවසන් දිනට භාණ්ඩාගාරය විසින් ණය නැවත අදාළ බැංකුවට ගෙවූ නමුත් සමාගම විසින් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූරණය නොකළ මුදල රු. 4,501,780,002 වුවත් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ රු. 6,632,493,444 ක් ලෙස දැක්වීමෙන් 2,130,7 12,842 කින් වැඩියෙන් දක්වා තිබු අතර ගෙවිය යුතු පොළිය වු රු. 790,127.700 ක් ද ගිණුම්ගත කර නොතිබුණි.

(නා) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක බැංකු ණය ශේෂය රු. 363,545,693 ක් වුවද උපලේඛනය අනුව ශේෂය රු. 363,801,080 ක් වූයෙන් රු. 255,387 ක වෙනසක් ද සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් වටිනාකම රු. 102,115,013 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයන්හි රු. 101,859,626 ක් ලෙස දැක්වීමෙන් රු. 255,387 ක වෙනසක් පැවතුණි.

(නැ) සමාලෝචිත වර්ෂයේ රු. 12,096,362 ක තොග ප්‍රතිපාදන සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවිය.

(නෑ) ණය වාරික මත ගිණුම්ගත කළ යුතු වාර්ෂික පොලී වටිනාකම රු. 37,387,5 17 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයන්හි රු. 38,063,199 ක් වූයෙන් රු. 680,476 ක වෙනසක් විය.

(නි) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ සමාලෝචිත වර්ෂයේ අවසන් තොගය තුල රු. 6,559,174 ක තොග නිකුත් නොවන තොග ලෙස පවතින බව නිරීක්ෂණය විය. තවද වටිනාකම හඳුනාගත නොහැකි ඉංජිනේරු තොග අයිතම 408 ක් භාවිතයෙන් ඉවත් කර ඇති අතර ඒ අනුව ලාභය හා අවසන් තොග ඒම අගයෙන් අඩි ගණනය වේ.

(නී) 2018 දෙසැම්බර් 31 දිනට රු. 48,772,108 ක් වූ කල්බදු ණයහිමියන්ට අදාල ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොවිය,

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලභා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් වශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණන සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා හට ලභා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 06 (1) (ඈ) (111) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලභා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව,

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතිරීති/විධානයට යොමුව	විස්තරය
(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරණ ශාණ්ඩාගාර චක්‍රලේඛය	චක්‍රලේඛයේ 6.5.1 වගන්නිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2021 මැයි 25 වන දිනය,
(ආ) 2019 අංක 24 දරණ දේශීය ආදායම් පනත	දීර්ඝ කාලයක සිට පැවත එන ගෙවිය යුතු ආදායම් බදු රු. 47,778,622 ක් හා ඊට අදාල දඩ මුදල් රු. 8,425,296 ක් ගෙවා නොතිබුණි.
(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛ අංක 842	ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. එසේම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) බඩල්ගම කිරි කර්මාන්තශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත් කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය බැහැරව විදේශීය ඉදිකිරීම් සමාගමකට ලභා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය විශේෂ ඉල්ලීමක් නොමැති ව්‍යාපෘතියක් (Unsolicited Project) ලෙස ක්‍රියාත්මක වී ඇති අතර ඊට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 23 යටතේ දක්වා ඇත්තේ විශේෂ තාක්ෂණික ඥානයකින් යුත් කොන්ත්‍රාත්කරුවන් සොයාගත නොහැකි ව්‍යාපෘති වලට පමණක් මෙසේ විශේෂ ඉල්ලීමක් නොමැති ව්‍යාපෘතියක් (Unsolicited) ලෙස ක්‍රියාත්මක කල හැකි බවයි. නමුත් මෙවැනි කර්මාන්තශාලාවක් ඉදිකිරීම ජාත්‍යාන්තර මිල කැඳවුම් මගින් කොන්ත්‍රාත්කරුවකු සොයා ගැනීමේ හැකියාව ඇත. ඒ අනුව ඉදිකිරීම් පිරිවැය ඇස්තමේන්තුව වූ යුරෝ 25,215,692 ක ප්‍රමාණය නිවැරදි පිරිවැයකින් හා උපරිම නත්වයකින් සිදු වී තිබේද යන්න තහවුරු නොවීය.

(ආ) කිරි නිෂ්පාදන කර්මාන්තශාල නවීකරන ව්‍යපෘතියට අදාල සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට කෙරීගෙන යන වැඩ ශේෂයන් ලෙස රු. 805,860,149 ක ශේෂයන් ඇතුලත්ව පැවති අතර සමාලෝචිත වර්ෂය තුලදී ඒ වෙනුවෙන් කිසිදු වියදමක් හෝ ගෙවා නොතිබූ බව නිරීක්ෂණය වූ අතර වර්ෂ අවසාන වන විටත් එම ශේෂයන් ප්‍රාග්ධනිත කිරීමට හෝ කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) බඩල්ගම නව කිරි කර්මාන්ත ශාලාව ඉදිකිරීමට අදාලව මිල්කෝ සමාගම හා ඩෙස්මි කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය සමග අත්සන් කර තිබූ ගිවිසුම තුල යුරෝ 25,215,692 ක ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රමාණතා පත්‍රයක් පිළියෙල කර නොතිබූ හෙයින් අදාල ඉදිකිරීම් සම්බන්ධ ගෙවීම් සිදුකිරීමේදී අදාල ගෙවීම්වල නිරවද්‍යතාවය හා ඉදිකිරීම් වල තත්ත්ව ප්‍රමිතිය සම්බන්ධයෙන් ව්‍යාකූලතාවයක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) බඩල්ගම නව කිරි කර්මාන්තශාලාව ඉදිකිරීමට අදාල ව යුරෝ 63,935,641 ක ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ව්‍යාපෘතියක මූලිකම කොටසක් වන උපදේශනය වෙනුවෙන් මුදල් ප්‍රතිපාදනය කර නොතිබූ අතර ව්‍යාපෘතිය ආරම්භකර පවත්වාගෙන යාමේදී උපදේශනයේ අවශ්‍යතාවය වෙනුවෙන් ක්ෂණික උපදේශකයන් පත්කිරීමට සිදුවීම මත අදාල ව්‍යාපෘතියේ උපදේශන සේවා වෙනුවෙන් දේශීය අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දේශීය අරමුදලින් ගෙවා තිබූ රු. 8,146,736 වටිනාකමින් උපදේශනය වෙනුවෙන් රු. 5,584,365 ක් හෙවත් සියයට 69 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය,

(ඉ) කිරි කර්මාන්නශාලා වෙනුවෙන් කළමණාකරන තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා බඩල්ගම කිරි කර්මාන්තශාලාව ඉදිකිරීමට අදාල බිල්පත් පරීක්ෂාකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,874,345 ක් විදේශීය සැපයුම්කරුවෙකු සඳහා ගෙවා තිබූ නමුත් අදාල කාර්යය සඳහා සැපයුම්කරු නෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) බඩල්ගම නව කිරි කර්මාන්තශාලාවේ කල්කිරි නිෂ්පාදන අංශයක් නොමැති වීම නිසා කොළඹ කිරි කර්මාන්තශාලාවේ දැනට ක්‍රියාත්මක වන කල්කිරි නිෂ්පාදන කටයුතු එම කර්මාන්තශාලාව ඉවත් කිරීමත් සමග නතර වන බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව එම වෙළෙඳපල අහිමිවීමක් සිදු වන බව නිරීක්ෂණය විය,

(උ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ රු. 6,451,500,834 ක ස්ථාවර වත්කම් වටිනාකමක් පෙන්නුම් කලද, ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සමාගම විසින් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. එසේ ම නිසි පරිදි නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛනද සමාගම විසින් පවත්වා නොගන්නා බැවින් ස්ථාවර වත්කම්වල පිරිවැය/පැවැත්ම, ක්ෂය ගණනය කිරීම්වල නිවැරදිතාවය, බැහැර කරන ලද ස්ථාවර වන්කම්වල පිරිවැය හා ක්ෂයකිරීම් වල ශේෂයේ නිවැරදිතාවය වර්ෂයේ එකතු කිරීම්වල නිවැරදිතාවය විගණනයේ දී පරීක්ෂා කිරීමට නොහැකිවිය.

(ඌ) අවුරුදු 50 ක කල්බදු පදනම මත ස්ථාන 39 ක පිහිටි ඉඩම් සමාගම යටනේ පාලනය වන නමුත් එම ඉඩම් අතරින්, ස්ථාන 07 ක පිහිටි ඉඩම්වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. එසේ ම සමාගම යටනේ පාලනය වූන ස්ථාන 19 ක පිහිටි ඉඩම් සඳහා ගිවිසුම් නොමැති අතර එම ඉඩම් අතරින්, ස්ථාන 13 ක පිහිටි ඉඩම්වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. මෙම ඉඩම්වල අයිතිය සමාගමට පවරා ගැනීම මෙතෙක් සිදුකර නොමැති අතර පිඹුරුපත් ද සමාගම සතු නොවන බව නිරීක්ෂණය විය. තව ද ඉහත පවරා නොගත් ඉඩම් තුල රු. 507,345,106 ක වටිනාකමකින් යුතු ගොඩනැගිලි ද ඉදිකර තිබුණි.

(එ) අය වැය යෝජනාවක් ලෙස කිරි ගොවීන්ට ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු සහනාධාර ලෙස විවිධ ණයගැතියන් තුළ ඇතුළත් රු. 278,981,206 ක් හා කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු. 6,909,758 ක් අයකර ගැනීමට හෝ ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) මෙම කිරි නිෂ්පාදන කර්මාන්තශාලාවේ මුළු වෙළඳ ණයගැනි ශේෂය රු. 387,384,930 ක් වූ අතර ඉන් රු. 33,063,229 ක් වටිනා ණයගැතියන් වර්ෂයක කාලයක් ඉක්මවූ ශේෂයන් විය. ණය පදනම මත නිකුත් කරන ලද හයිලන්ඩ් නිෂ්පාදන සඳහා ලැබිය යුතු වසරක් ඉක්මවූ ශේෂය තුළ ඇතුළත් රු. 23,301,860 ක් වටිනා ණයගැතියන් 75 දෙනකු ක්‍රියාකාරී නොවන ණය ලෙස හඳුනාගෙන තිබුණු අතර එය වසරක් ඉක්මවූ ණයගැනි ශේෂයෙන් සියයට 68 ක් වේ. එම ණයගැතියන් සම්බන්ධයෙන් විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් හෝ සමාගම ගෙන නොතිබුණි.

(ඔ) අඹේවෙල කර්මාන්තශාලාව විසින් 2017 වර්ෂය හා ඊට පෙර මිලදී ගැනීම් ඇනවුම් වෙනුවෙන් රු. 1,289,342 ක් අන්තිකාරම් ලෙස විවිධ ආයතන හා පුද්ගලයන්හට ගෙවීම් කර නිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යය ඉටුකරවාගෙන නොතිබූ අතර අත්තිකාරම් ද නිරවුල් වී නොතිබුණි.

(ඕ) උපලේඛනය අනුව දිගන කර්මාන්තශාලාවේ වෙළඳ ණයගැනි ශේෂය රු. 77,796,261 ක් වූ අතර ඉන් රු. 6,345,394 ක් වසර 5 ඉක්මවූ ශේෂ වන අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 8 ක් විය.

(ක) පොල්ගහවෙල කර්මාන්තශාලාවේ 2018 දෙසැම්බර් 31 දිනට රු. 16,027,297 ක් වූ ණයගැති ශේෂය තුළ සත්ත්ව ආහාර ණයගැතියෝ රු. 11,378,834 ක් විය.එම ශේෂයෙන් රු. 3,248,760 ක් එනම් සියයට 28 ක් වසර 13 ක් ඉක්මවා තිබුණි. තවද රු. 4,648,233 ක් වූ මුළ ප්‍රවාහන ණයගැනියන් වසර 13 ක් ඉක්මවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(කා) සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් අලෙවි කරන ලද නිෂ්පාදන මිල කිරීම සම්බන්ධයෙන් නියැදි විගණන පරීක්ෂාවක් ලෙස අඹේවෙල කිරි කර්මාන්තශාලාවෙහි සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂනය විය.

(i) මිල ලේඛනයෙහි සඳහන් ඇතැම් නිෂ්පාදනවල මිල ගණන් සමාලෝචිත වර්ෂය තුළ වෙනස් කර ඇති අතර ඊට පෙර පැවති මිල ගණන් පිළිබඳවද තොරතුරු නොමැති වීමෙන් එම නිෂ්පාදිත මිල කර ඇති ආකාරය හඳුනාගත නොහැකි විය.

(ii) ග්‍රෑම් 400 කිරි පිටි පැකට්ටුවක සුභසාධක මිල රු. 256.25 ක් වුවද වර්ෂය තුළ කිරි පිටි පැකට් 32,514 ක් රු. 220 බැගින් විකුණුම් කර ඇති අතර විකුණුම් වටිනාකම. රු. 11,786,633 කින් ආදායම අහිමි ව තිබුණි.

(කැ) සමාගමට අයත් දිගන කිරි කර්මාන්ත ශාලාවේ සමාලෝචිත වර්ෂයේ තොග බෙදාහැරීමේ වටිනාකම අගය කිරීමේ දී එක් එක් නිෂ්පාදනය සඳහා මුළු වර්ෂයේ ම එකම මිලක් යටතේ නිෂ්පාදන තොග කපා හැරීම් ගණනය කර තිබුණ ද කොළඹ කිරි කර්මාන්ත ශාලාවේ සමාලෝචිත වර්ෂයේ තොග කපා හැරීමේ වටිනාකම අගය කිරීමේ දී එක් එක් නිෂ්පාදනය සඳහා විවිධ මිල ගණන් යටතේ නිෂ්පාදන තොග කපා හැරීම් ගණනය කර තිබුණි. ඒ අනුව සමාගමට තොග කපා හැරීමේ වටිනාකම අගය කිරීමට නිශ්චිත වූ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය.

(කෑ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසාන නිෂ්පාදන තොග වටිනාකම් අගය කිරීමේ දී නිෂ්පාදන වර්ග 04 ක් යටතේ ඇති නිෂ්පාදන 20 ක් සම්බන්ධයෙන් වූ ඒකක පිරිවැය වටිනාකම් එක් එක් කර්මාන්තශාලාවෙන් කර්මාන්තශාලාවට රු. 57.88 සිට රු. 366.07 දක්වා වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය.

(කි) 2017 ජූලි මස සිට සිදුකළ කිරිපිටි නිෂ්පාදනය කිලෝග්‍රෑම් 771,625 ක් දෝෂ රහිත බවට පරීක්ෂණාගාර වාර්තා නිකුත් කර තිබූ නමුත් 2017 අගෝස්තු මස නිකුත් කළ කිරිපිටි මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබීමෙන් පසු නැවත ගබඩාව වෙත ගෙන්වා ගත් කිරිපිටි තොගයෙන් කිලෝග්‍රෑම් 666,075 ක ප්‍රමාණයක් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර අඹේවෙල කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි.

(කී) දිගන කිරි කර්මාන්තශාලාවේ සමාලෝචිත වර්ෂයේ අවසන් තොග තුල රු. 13,533,994 ක වටිනාකමකින් යුතු අවුරුදු 5 ක කාලයක සිට නිකුත් නොවන අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය තොග පවතින බව නිරීක්ෂණය වූ අතර මෙම තොග භාවිතයට ගත නොහැකි බැවින් ඒවා එම වටිනාකමෙන් තොග අධිගණනය වී තිබුණි.

(කු) පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවේ සමාලෝචිත වර්ෂයේ අවසන් තොග තුල රු. 1,043,529 ක වටිනාකමකින් යුතු නිකුත් නොවන ඉංජිනේරු තොග පවතින බව නිරීක්ෂණය විය.

(කූ) කොළඹ කර්මාන්තශාලාවේ සමාලොචිත වර්ෂයේ තොග කපා හැරීම් රු. 5,132,845 ක් වන අතර නියැදි පරීක්ෂාවේ දී ඒ යටතේ දක්වා ඇති එක් එක් නිෂ්පාදනයන්ගේ තොග වටිනාකම් ගණනය කිරීමට ශාවිතා කර ඇති ඒකක මිල ගණන් වෙනස් වී ඇති අතර එම මිල වෙනස්වීම් 47% සිට 1223% දක්වා වූ අසාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

(කෙ) 2015 අප්‍රේල් 08 දිනැති අංක. අමප/1.5/0205/631/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බඩල්ගම ව්‍යාපෘතිය සඳහා සමාගම හා මහා ශාණ්ඩාගාරය සමග ප්‍රතිණය ගිවිසුමකට එළඹිය යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දින දක්වාම ගිවිසුමකට එළඹ නොතිබුණි.

(කේ) 2018 දෙසැම්බර් 31 දිනට ජාතික කිරි මණ්ඩලයට ගෙවිය යුතු 1998 වර්ෂයේ සිට පැවත එන රු. 2,108,005 ක ණය මුදලක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(කො) අත්නිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම් ශේෂය තුළ වර්ෂ 5 ක් ඉක්මවූ කලින් ගෙවීම් ශේෂය රු. 4,284,638 ක් වූ අතර ඉන් රු. 1,389,285 ක ආරම්භක ශේෂයක්ද රු. 30,092 ක් වූ බැර ශේෂ ද පැවතියද ඒවා නිරවුල් කිරීමට හෝ අදාළ පාර්ශව වෙතින් එයට අදාළ භාණ්ඩ හෝ සේවාව ලභාගැනීමට කටයුතු කර නොතිබුණි.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සමාගම විසින් ලබා දුන් තොරතුරු අනුව සමාගම විසින් භාවිතයට ගනු ලබන වාහන 78 ක් පවතින අතර එයින් වෙනත් ආයතන සතු සමාගම විසින් භාවිතයට ගනු ලබන වාහන 04 ක් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගම විසින් කොළඹ කිරි කර්මාන්තශාලාවේ ණයගැතියන් 04 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 10,910,901 ක් වෙනුවෙන් 2017 හා 2019 වර්ෂ වල නඩු පවරා තිබු බව නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයෙහි ගෙවියයුතු ගිණුම් යටතේ ප්‍රධාන කාර්යාලයට අයත් රු. 56,203,918 වූ පැරණි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රු. 261,537,239 ක් වූ මුළු වෙළඳ ණයහිමි වටිනාකමෙන් ණයහිමියන් රු. 254,842,627 ක් අවුරුදු 1 ත් 5 ත් ද, අවුරුදු 5 ට වැඩි ණය හමියන්ගේ වටිනාකම රු. 6,694,612 ක් ද විය.

(ඉ) සමාලොචිත වර්ෂය තුළ සමාගමෙහි ගමන් වියදම්, විකුණුම් කොමිස් හා ගබඩා වියදම් පිළිවෙලින් සියයට 59 ක්, 1049 ක් හා 325 කින් ඉහළ ගොස් තිබුනද විකුණුම් ඉහළ ගොස් ඇත්තේ සියයට 14 කින් බව නිරීක්ෂණය විය. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ කිරි මිලදී ගැනීම සියයකට 1 කින් අඩු වී ඇතත් සංවර්ධන පිරිවැය සියයකට 18 කින්ද බව්සර් පිරිවැය සියයට 31 ක් ද, ඩීසල් පිරිවැය සියයට 32 ක් ද ජලය සඳහා පිරිවැය සියයට 40 ක්ද; ප්‍රවාහන පිරිවැය සියයට 242 කින්ද සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දිනට එක් එක් කර්මාන්තශාලා මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අනුව හානිකරණය සඳහා වෙන්කිරීම් කළ පසු වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ශේෂය රු. 1,925,355,045 ක් වුවද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 1,288,433,433 ක් වූයෙන් ශේෂයන් දෙක අතර රු. 307,026,781 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවෙහි විකුණුම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව සහ කර්මාන්තශාලාවෙහි ගිණුම් අනුව එකිනෙකට වෙනස් බැවින් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආර්ථික සේවා ගාස්තු රු. 10,418,126 හි නිවැරදිභාවය විගණනයට තහවුරු නොවීය.

ඩබ්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

වත්කම්	සටහන	දෙසැම්බර් 31 වන දිනට 2018 රු:	දෙසැම්බර් 31 වන දිනට 2017 රු:
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**3**	6,451,500,834	6,883,830,329
නොනිමි ප්‍රාග්ධන වැඩ	**4**	11,894,455,027	9,458,612,172
මූල්‍ය උපකරණ -ක්‍රමක්ෂය වූ පිරිවැය	**5**	769,263,440	608,415,927
දීර්ඝ කාලීන අත්තිකාරම්	**6**	356,287,245	560,536,942
මුළු ජංගම නොවන වත්කම්		19,471,506,546	17,511,395,370
ජංගම වත්කම්			
තොග	**7**	1,505,734,350	1,744,363,882
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**8**	1,288,433,433	1,496,902,471
ලැබිය යුතු ආදායම් බදු	**9**	172,903,239	115,524,339
මුදල් හා මුදල් සමාන දෑ	**10**	19,269,258	24,748,174
මුළු ජංගම වත්කම්		2,986,340,280	3,381,538,865
මුළු වත්කම්		22,457,846,826	20,892,934,235
ස්කන්ධ සහ බැරකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**11**	319,454,060	319,454,060
ප්‍රාග්ධන සංචිතය	**12**	25,000,000	25,000,000
ප්‍රත්‍යාගණන සංචිතය		336,454,463	336,454,463
නිදන් අරමුදල	**13**	1,689,978	1,689,978
රඳවාගත් ඉපැයුම්		785,181,360	1,197,693,238
කොටස් හිමියන්ගේ අරමුදල		1,467,779,860	1,880,291,739
ජංගම නොවන බැරකම්			
විලම්භිත බදු බැරකම	**14**	-	190,386,471
පොලී රහිත ණය ගැනීම්	**15**	2,108,063	2,108,063
පොලී සහිත ණය ගැනුම් - දීර්ඝ කාලීන	**15**	18,202,111,219	16,085,402,450
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික	**16**	527,308,101	559,394,914
විලම්භිත ආදායම - රජයේ ප්‍රදානය	**17**	41,712,392	56,896,504
මුළු ජංගම නොවන බැරකම්		18,773,239,775	16,894,188,401
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	**18**	841,105,671	877,336,031
පොලී සහිත ණය ගැනුම් - කෙටි කාලීන	**15**	123,568,773	123,944,715
බැංකු අයිරා	**19**	1,252,152,747	1,117,173,348
මුළු ජංගම බැරකම්		2,216,827,191	2,118,454,095
මුළු ස්කන්ධ සහ බැරකම්		22,457,846,826	20,892,934,235

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීම්ය

06 පිටුවේ සිට 36 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලද බවට සහතික කරමි.

.....
එම්.ජී.ජී. ප්‍රේමතිලක මහතා
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කළේ 19.02. 2021

.....
එල්. බී. වික්‍රමසිංහ මයා
සභාපති

.....
ජී.ඒ. අරුණ ප්‍රසන්න මයා
අධ්‍යක්ෂ

	සටහන	2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රු:	2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රු:
ආදායම	20	11,612,344,021	10,161,297,363
විකුණුම් පිරිවැය		(11,385,405,568)	(9,816,602,389)
දළ ලාභය		226,938,453	344,694,974
වෙනත් මෙහෙයුම් ආදායම	21	366,304,291	363,516,040
		593,242,745	708,211,015
පරිපාලන වියදම්		(640,583,272)	(675,736,219)
බෙදාහැරීමේ වියදම්		(475,008,669)	(351,383,353)
වෙනත් වියදම්		(18,071,620)	(84,960,167)
මෙහෙයුම්වලින් ලාභය/ (අලාභය)		(540,420,816)	(403,868,724)
මූල්‍ය ආදායම	22	46,135,691	68,268,545
මූල්‍ය වියදම්	23	(189,164,365)	(99,332,951)
බදුවලට පෙර ශුද්ධ අලාභය		(683,449,491)	(434,933,130)
ආදායම් බදු වියදම්	24	201,663,631	(171,265,774)
බදුවලින් පසු වසරේ ශුද්ධ අලාභය		(481,785,860)	(606,198,904)
වෙනත් විස්තීර්ණ ආදායම			
ලාභයට හෝ පාඩුවට ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන අයිතමය:		-	
බදු අඩුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම නැවත මැනීම		69,273,982	(31,090,295)
බදු අඩු කර වෙනත් මුළු විස්තීර්ණ ආදායම		69,273,982	(31,090,295)
මුළු විස්තීර්ණ ආදායම		(412,511,878)	(637,289,198)
කොටසකට මූලික ඉපයීම්/ (අලාභය)	25	(15.08)	(18.98)

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීම්ය

06 පිටුවේ සිට 36 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

	ප්‍රකාශිත ප්‍රාග්ධන රු:	ප්‍රාග්ධන සංචිතය රු:	ප්‍රත්‍යාගණන සංචිතය රු:	නිදන් අරමුදල රු:	රඳවා ගත් ඉපයුම් රු:	එකතුව රු:
2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	1,665,982,437	2,348,580,937
අපහායන ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	-	-	-	-	169,000,000	169,000,000
2016 දෙසැම්බර් 31 වන දිනට ප්‍රත්‍යාගණිත ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	1,834,982,437	2,517,580,937
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	-	(606,198,904)	(606,198,904)
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	-	-	(31,090,295)	(31,090,295)
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	1,197,693,238	1,880,291,738
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	-	(481,785,860)	(481,785,860)
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	-	-	69,273,982.12	69,273,982
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	785,181,360	1,467,779,860

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

06 පිටුවේ සිට 36 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

	දෙසැම්බර් 31 වන දිනට 2018 රු:	දෙසැම්බර් 31 වන දිනට 2017 රු:
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
බදුවලට පෙර ශුද්ධ ලාභය	(683,449,491)	(434,933,130)
පහත දැ සඳහා ගැලපීම්;		
දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම	542,428,556	409,914,031
ආයෝජනවලින් ආදායම	(46,135,691)	(68,268,545)
පොළී වියදම්	182,496,282	92,475,371
කල්බදු පොළිය	6,730,089	8,503,419
විලම්භිත ප්‍රදාන මත පිළිගත් ආදායම	(19,757,115)	(38,614,634)
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	-	(777,885)
හුවමාරු ලාභය	(88,548,642)	(9,683,424)
ප්‍රතිපාදන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික	87,046,552	90,080,655
අපහරණ ලාභය	(12,600,907)	(9,348,044)
ESC - කපා හැරීම්	12,434,370	-
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	(19,355,997)	39,347,814
ඉන්වෙන්ට්‍රිවල (වැඩිවීම්)/අඩුවීම්	238,629,532	(895,251,375)
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම්)/අඩුවීම්	198,690,823	(155,051,768)
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල වැඩිවීම්/(අඩුවීම්)	(36,230,360)	179,027,822
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්	381,733,998	(831,927,507)
ගෙවූ පොළිය	(182,496,282)	(92,475,371)
ගෙවූ බදු - ආර්ථික සේවා ගාස්තු සහ ආදායම් බද්ද	(60,035,055)	(51,881,194)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් - පාරිතෝෂික	(38,582,223)	(42,866,940)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/ (භාවිතා කළ)	100,620,438	(1,019,151,012)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම්	(102,363,192)	(151,058,361)
ඉදිකිරීම් කාර්යයන්හිදී දේපළ, පිරියත හා උපකරණවල ආයෝජන	(1,695,632,797)	(2,812,115,004)
වත්කම් අපහරණයෙන් ලැබූ මුදල්	12,670,787	9,348,044
ලැබූ පොළිය	46,135,691	68,268,545
නව /(මුදල් ආපසු ගැනීමේ) කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ආයොජන (ශුද්ධ)	(72,298,872)	370,670,156
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	(1,811,488,384)	(2,514,886,620)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ලැබූ රජයේ ප්‍රදාන	4,573,003	20,999,619
ගෙවූ බදු වාරික	(28,501,283)	(31,021,689)
වසර තුළ ප්‍රදානය කළ ණය	2,239,963,647	2,688,148,110
ණය සහ ණයගැනුම් ආපසු ගෙවීම්	(101,859,626)	(93,579,736)
දිගුකාලීන අත්තිකාරම්වල හුවමාරු බලපෑම ගැලපීම	(543,766,109)	-
මූල්‍ය ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	1,570,409,632	2,584,546,303
මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම	(140,458,314)	(949,491,329)
වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන අ)	(1,092,425,174)	(142,933,845)
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන ආ)	(1,232,883,488)	(1,092,425,174)

	දෙසැම්බර් 31 වන දිනට 2018 රු:	දෙසැම්බර් 31 වන දිනට 2017 රු:
වසර ආරම්භයේදී		
බැංකුවල ශේෂයන්	20,487,923	31,668,018
අතැති සුළු මුදල්	4,260,251	407,350
	24,748,174	32,075,368
බැංකු අයිරා	(1,117,173,348)	(175,009,212)
	(1,092,425,174)	(142,933,845)
වසර අවසානයේදී		
බැංකුවල ශේෂයන්	13,963,657	20,487,923
අතැති සුළු මුදල්	5,305,601	4,260,251
	19,269,258	24,748,174
බැංකු අයිරා	(1,252,152,747)	(1,117,173,348)
	(1,232,883,488)	(1,092,425,174)

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

06 පිටුවේ සිට 36 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

1.1. **සංස්ථානික තොරතුරු**

1.1.1 **නෛතික සහ නිත්‍යවාස ස්වභාවය**

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම (සමාගම) යනු ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ එහි නිත්‍ය වාසය සහිත සීමිත බැඳීම් සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්) සමාගම" ලෙස මෙම සමාගම 1996 මැයි 09 දින සංස්ථාගත කර ඇත. සමාගමේ නම " සීමාසහිත මිල්කෝ (පුද්) සමාගම" ලෙස 2001 ජූලි 23 වන දින වෙනස් කරනු ලැබීය. ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට 1998 පෙබරවාරි 3 දින වන විට අයත් වූ සහ එම සමාගම භාවිතා කළ (ඉඩම් හැර) සියලු දේපළ, පිරියත හා උපකරණවල අයිතිය සහ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන (පුද්) සමාගම විසින් එම දිනය වන විට භාවිතා කළ ඉඩම් සහ ගොඩනැගිලිවල බදු අයිතිය, 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරුකර තිබේ. එසේ මාරු කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම රු 306,500,020 කි. තවද, 2000 අගෝස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලිවල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20,427,900/- ක මුදල, ඒකාබද්ධ ව්‍යාපාරය බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අත් හැර දමා ඇත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 45, නාවල පාර, කොළඹ 05 යන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල පිහිටා ඇති අතර 2018 දෙසැම්බර් 31 වන විට බඩල්ගම කම්හල ඉදිකෙරෙමින් පැවතිණි.

1.1.2 **ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් ස්වභාවය**

වර්ෂය තුළ දී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසිරීම, බෙදාහැරීම හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමයි.

1.1.3 **නිකුත් කිරීමට බලය ලබාදීමේ දිනය**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2021.02.19 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

1.1.4 **මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

1.2. **ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

1.2.1 **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1.2.1.1 **මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS / LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

1.2.1.2 ***මැනීමේ පදනම***

SLFRS / LKAS මගින් නියම කරන පරිදි සාධාරණ අගය අනුව ගණන් බැලූ ඇතැම් වත්කම් සහ වගකීම් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකස් කර ඇත.

1.2.1.3 **කෘත්‍යාත්මක සහ නිරූපණ ව්‍යවහාර මුදල**

අදාළ අස්ථිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මනිනු ලැබේ. (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල) සමාගමේ කෘත්‍ය සහ නිරූපණ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කර ඇත.

1.2.1.4 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 වන දිනට සමාගමෙහි මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/ SLFRS) ප්‍රකාරව පිළියෙල කර ඇත.

1.2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම සඳහා සමාගමට ඇති හැකියාව පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමක් සිදු කරනු ලදුව, පූර්වාපේක්ෂිත අනාගතය තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවශ්‍ය සම්පත් සමාගම සතු බවට සෑහීමට පත්විය. තවද සමාගමට අඛණ්ඩ පැවැත්මකට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයන් ඇති කරන වැදගත් අවිනිශ්චිතතාවක් කළමනාකාරීත්වයට දැනගන්නට නැත. එබැවින් අඛණ්ඩ පැවත්ම පදනම් කොටගෙන තවදුරටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

1.2.1.6 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් නොවෙනස්ව යොදාගෙන ඇති අතර, එම ප්‍රතිපත්ති ඉකුත් වසරේ ප්‍රතිපත්තිවලට අනුරූපය. අවශ්‍ය විට ඉකුත් වසරේ අගයන් සහ පාඨ වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට/වර්ගීකරණයට ගැලපෙන පරිදි යළි සකසා ඇත.

1.2.1.7 විදේශීය මුදල් ගනුදෙනු

සියලු විදේශ විනිමය ගනුදෙනු, ගනුදෙනු කළ දිනයන්ට අදාළ විනිමය අනුපාතයෙන් වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදලින් අගය දක්වා ඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන මුදලට පරිවර්තනය කරනු ලබන අතර එහි ප්‍රතිඵල වශයෙන් සිදුවන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

මුදල්මය නොවන වත්කම් සහ බැරකම්, වටිනාකම් නිශ්චය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ සඳහා හේතු අනෙකුත් විස්තීර්ණ ආදායමේ ගිණුම් ගත කොට ඇත.

1.2.1.8 ද්‍රව්‍යමය භාවය සහ සමූහනය

සමාන අයිතමයන්ගේ සෑම ද්‍රව්‍ය පංතියක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන් කර දක්වා ඇත. අසමාන ස්වභාවයක් ඇති හෝ කාර්ය භාරය අතින් අසමාන වන අයිතම, ද්‍රව්‍ය නොවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

1.2.1.9 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

a) **විනිශ්චයන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමේ ක්‍රියාදාමයේදී, මූල්‍ය ප්‍රකාශවල පිළිගත් ප්‍රමාණ කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑම් ඇතිකරන ඇස්තමේන්තු කිරීම් සම්බන්ධ ඒවා හැරුණු විට, කළමනාකාරිත්වය විනිශ්චයන් සිදු කොට ඇත.

b) **ඇස්තමේන්තු සහ උපකල්පන**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, වාර්තා කොට ඇති ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් ප්‍රමාණ සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන්නා වූ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරිත්වය සිදුකිරීම අවශ්‍ය වේ.

මීළඟ මුදල් වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත, මූල්‍ය තත්වයේ දිනට ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනාගතය සහ අනෙකුත් වැදගත් මූලාශ්‍රවලට අදාල වැදගත් උපකල්පන සැලකිල්ලට ලක් කර තිබේ.

1.3 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.3.1 දේපළ, පිරියත සහ උපකරණ

a) මැනුම

සියලු දේපළ පිරියත සහ උපකරණ, ආරම්භයේදී පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. අනතුරුව දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එබඳු වත්කම් අයත්වන සම්පූර්ණ අයිතම පන්තිය ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

එදිනෙදා සේවා පිරිවැය, අඩු සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමින් සමුච්චිත හානිය හැරුණු විට දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අනුව සඳහන් වේ. පිළිගැනීමට අවශ්‍ය නිර්ණායක සපුරා තිබේ නම් එම පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අවස්ථාවේදී දරන්නට සිදුවන පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන්නේ නම්, සමාගම එබඳු කොටස්, විශේෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත තනි තනි වත්කම් සේ සලකා ඒ අනුව එම අයිතම ක්ෂය කරනු ඇත.

ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරනු ලබන විට, පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම්, එහි පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිස්ථාපනයක් ලෙස ධාරණ අගය තුළ පිළිගනු ලබනු ඇත. අනෙක් සියලු අළුත්වැඩියාවන් සහ නඩත්තු පිරිවැය, එම පිරිවැය දරනු ලැබූ අවස්ථාවේ ලාභ හෝ අලාභවල හඳුනාගනු ඇත.

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් බැහැර කිරීම මත හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස) වේ නම් එය වත්කම පිළිගැනීම අත්හිටවූ වර්ෂයේ විස්තීරණ ගිණුම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

b) දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ආයුකාලය

සෑම වාර්තාකරණ දිනකටම වත්කමක ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සමාගම විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම අගයන්, අනුපාත සහ ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී වෘත්තීය විශේෂඥයන්ගේ මතය අනුව කළමනාකාරිත්වය එළඹී විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

c) ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය පුරා සරල රේඛීය පදනම මත ලාභයේ හෝ පාඩුවේ ක්ෂයවීම හඳුනා ගනු ලබන අතර එසේ කරනුයේ වත්කමෙහි අන්තර්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව, එම ක්‍රමය ඉතා සමීපව පිළිඹිබු කරන නිසාය.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාල සීමාව හෝ එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය යන කාල දෙකින් අඩු කාලය මතය.

ඵලදායී ආයුකාලයන් පහත පරිදි වේ:

ගොඩනැගිලි	අවුරුදු 20 සිට 25 දක්වා
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 04 සිට 30 දක්වා
ගෘහ භාන්ඩ සහ සවිකිරීම්	අවුරුදු 03 සිට 05 දක්වා
විද්‍යාගාර උපකරණ	අවුරුදු 03 සිට 05 දක්වා
මෝටර් වාහන	අවුරුදු 08 සිට 15 දක්වා
මෙවලම් සහ උපකරණ	අවුරුදු 03 සිට 10 දක්වා
කාර්යාල උපකරණ	අවුරුදු 2.5 සිට 05 දක්වා
බෝතල් හා ඇසුරුම් භාජන	අවුරුදු 04
පරිගණක	අවුරුදු 02 සිට 04 දක්වා
බෝතල් ශීතකරණ	අවුරුදු 2.5 සිට 05 දක්වා
මෘදුකාංග	අවුරුදු 03
කිරි භාජන	අවුරුදු 05

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය.

d) ප්‍රතිසාධන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ කාර්ය සාධන ප්‍රමිතීන් ලෙස මුලින්ම අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිසාධනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා කෙරෙන අලුත්වැඩියාවන් හෝ නඩත්තු කටයුතු සඳහා වැය වෙන වියදම.

e) ණය පිරිවැය

ඍජුවම, කිසියම් අපේක්ෂා කළ අරමුණ ඉටු කිරීම සඳහා හෝ විකිණීම සඳහා යම් කාලයක් ගන්නා සුදුසුකම් ඇති වත්කමක් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සම්බන්ධ වන ණය ගැනීම් පිරිවැය අදාළ වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කෙරේ. අනෙකුත් සියලු ණය ගැනීම් පිරිවැය ඒවා සිදුවෙන කාලය අනුව වැය සටහන් කර ඇත.

f) ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් බැහැර කිරීම මත හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. වත්කම පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙසය.

1.3.2 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අනුව මූලික පිළිගැනීම මත මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිවීම් අලාභය අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ.

සීමිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය මත ක්‍රමක්ෂය කර ඇති අතර අස්පෘශ්‍ය වත්කම් දුර්වල විය හැකි බවට ඇඟවීමක් ඇති සෑම අවස්ථාවකදීම හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. සීමිත ඵලදායී ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කෙරේ.

වත්කම් තුළ අන්තර්ගත වන අපේක්ෂිත ඵලදායී ආයුකාලයේ වෙනස්වීම් හෝ අපේක්ෂිත පරිභෝජන රටාව ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කිරීමේ කාල සීමාව හෝ ක්‍රමවේදය සුදුසු පරිදි වෙනස් කිරීමෙන් වන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය කිරීමේ වියදම අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුරූපව වියදම් කාණ්ඩයේ ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගෙන ඇත.

1.3.3 කල්බදු

a) මූල්‍ය කල්බදු - සමාගම කල්බදුකරු වන විට

හිමිකාරිත්වයට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරනුකුලව පවරනු ලැබූ විටදී ඒවා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූල්‍ය කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත අපහායන අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දැට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාල සීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.
එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය ප්‍රාග්ධන ගත කරනු ලබන අතර කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකින් වඩා කෙටි කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ අගය මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්භිත කර ක්‍රමක්ෂයකරනු ලැබේ.

b) මෙහෙයුම් කල්බදු

කල්බදු කාලය යටතේ වත්කමක සියලු අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු හිමිකරු විසින් සැබවින්ම දරන විටදි, එම කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කල්බදු ගෙවීම් (රක්ෂණ සහ නඩත්තු වැනි සේවා පිරිවැය හැර) සරල මාර්ගික පදනමක් මත කල්බදු කාලය පුරා ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස පෙන්වා ඇත.

1.3.4 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ දිනයකදීම කිසියම් වත්කමක් අපහායනය වීමේ ඇඟවීමක් ඇත්දැයි නිශ්චිතව දැන ගැනීම සඳහා සමාගම විසින් ඇස්මේන්තු කරනු ලැබේ. එවැනි අපහායන ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවන් අවශ්‍ය විට සමාගම වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ආපසු අයකර ගත හැකි අගය යනු වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්. අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම අපහායනය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ භාවිතයේ පවතින වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්කමට විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම්වල අපහායන පාඩු, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් අපහායන අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. මණ්ඩලය විසින් වත්කමේ එවැනි නිරීක්ෂණයක් ඇත්නම් ආපසු එය අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

කළින් හඳුනාගත් අපහායන අලාභයක් ප්‍රතිවර්ත කරනුයේ අවසන් අපහායන අලාභය හඳුනාගනු ලැබූ අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය නිර්ණය කිරීම සඳහා භාවිතාකළ ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්නම් පමණි. එසේ සිදුව ඇති විටදී, වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය දක්වා ඉහළ නංවනු ලැබේ. ඉහළ නංවනු ලැබූ අගය, පෙර වසරවලදී වත්කම සඳහා අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති නම්, ක්ෂයවීම අඩුකොට නිර්ණය කරනු ලැබීමට ඉඩ තිබූ ධාරණ අගය "ඉක්මවා යාමට" නොහැක. එබදු ප්‍රත්‍යාවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

1.3.5 නොනිමි ප්‍රාග්ධන වැඩ

වත්කම ප්‍රථම වරට උපයෝජනයට යොදවන විට, දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

1.3.6 මූල්‍ය වත්කම්

පහත සඳහන් කාණ්ඩවලට සමාගම තම වත්කම් වර්ග කරනු ලබයි; ඒවා නම් ලාභය හා අලාභය මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීමට ඇති සහ කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය වත්කම් වේ. මූල්‍ය වත්කම් අත්කර ගනු ලැබූ කාර්යය මත වර්ගීකරණය රඳා පවතී. මූලික පිළිගැනීම මත සිය මූල්‍ය වත්කම්වල වර්ගීකරණය කළමනාකාරිත්වය තීරණය කරන අතර, මෙම වර්ග නාමය සෑම වාර්තාකරණ දිනකදීම නැවැත ඇගයීමට පාත්‍ර කරයි.

1.3.6.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

මූලික හඳුනාගැනීමේදී සංස්ථාව සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි. මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර, ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයක නොමැති වත්කම් ඇති විට එය ගනුදෙනු පිරිවැයට සෘජුවම සම්බන්ධ කෙරේ.

වෙළඳපොළ සම්ප්‍රදාය සහ නියෝග මගින් නියමිත කාලරාමුවක් තුළ භාරදිය යුතු මූල්‍ය වත්කම් මිලට ගෙන හෝ විකුණා ඇත්නම් ඒවා විකිණීම හෝ මිලට ගැනීම සිදුවූ දිනයේදී හඳුනාගනු ඇත. එනම් වත්කම මිලට ගැනීමට හෝ විකිණීමට සමාගම එකඟ වූ දිනයයි.

මුදල්, ස්ථිර තැන්පතු සහ වෙළඳාමෙහි සහ වෙනත් ලැබිය යුතු දේවල ආයෝජන සමාගමේ මූල්‍ය වත්කම්වලට අයත් වේ.

1.3.6.2 පසු ගණන මිනුම්කරණය

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම පහත පරිදි වර්ගීකරණය මත රඳා පවතී.

(a) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වත්කම් සහ වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ නැවත මිලදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළඳාම් සඳහා රඳවා ඇති බව වර්ගීකරණය කරනු ලැබේ.

(b) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු ව්‍යුත්පන්න නොවන සහ සක්‍රිය වෙළෙඳපොළ තුළ දක්වා නොමැති ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් වේ. මූලික මැනීමෙන් පසුව එවැනි මූල්‍ය වත්කම්, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මගින් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

(c) කල්පිරීම් දක්වා රඳවාගත් ආයෝජන

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීමක් සහ ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම් දක්වා රඳවාගත් ගනයට අයත් වන අතර එය කෙරෙන්නේ එම වත්කම් කල් පිරීම් දක්වා රඳවා තබාගැනීමට සමාගමට හැකියාව සහ ධනාත්මක අදහස ඇති විටය. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම් දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන හානි අඩු කොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත. හානිය නිසා ඇති වන පාඩු මූල්‍ය පිරිවැයේ විස්තිර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

(d) විකිණීම් සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවලට ස්කන්ධ සහ ණය සුරකුම් ඇතුළත් වේ. විකිණීම් සඳහා ලබා ගත හැකි ලෙස වර්ගීකරණය කර ඇති ස්කන්ධ ආයෝජන යනු ඒවා වෙළඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර නොමැති, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් නම් කර නොමැති ඒවා වෙයි. මෙම කාණ්ඩයේ ණය සුරකුම්පත් යනු අවිනිශ්චිත කාලයක් සඳහා පැවැත්වීමට අදහස් කරන ඒවා වන අතර ද්‍රවශීලතාවයේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්වයන්හි වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් විකුණනු ලබන ඒවා වෙයි.

මූලික මිනුම්කරණයෙන් පසු. විකිණීම් සඳහා ඇති මූල්‍ය ආයෝජන තදනන්තරව සාධාරණ අගයට මනිනු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ, විකිණීම් සඳහා පවතින ස්කන්ධ (වෙනත් විස්තීරණ ආදායම) යටතේ හඳුනා ගැනේ. ආයෝජනය බැහැර කරනු ලැබීමේදී, ස්කන්ධ යටතේ ඊට අදාළව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේදී 'වෙනත් මෙහෙයුම් ආදායම' යටතේ හඳුනා ගනී. සමාගම විසින් සමාන සුරකුම්වලින් එක් ආයොජනයකට වඩා දරණ අවස්ථාවන්හිදී, ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කරන පදනම යටතේ විකිණීමට නියමිතය. විකිණීම් සඳහා පවතින මූල්‍ය ආයෝජන මගින් උපයනු ලබන පොළී ආදායම, සඵල පොළී අනුපාතය මත ගණනය කර පොළී ආදායම යටතේ ප්‍රකාශ කරනු ලැබේ. ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ආදායම් ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම'

යටතේ හඳුනාගනී. එවැනි ආයෝජන අපහායනය මත වන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ 'මූල්‍ය ආයෝජන මත අපහායන අලාභවල' හඳුනාගන්නා අතර විකිණීම සඳහා පවතින සංචිතයෙන් ඉවත් කරනු ලැබේ.

(ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් කෙටි කාලීනව විකිණීමට ඇති හැකියාව සහ අභිලාෂය තවදුරටත් යෝග්‍ය ද යන්න විමසීම පිණිස සමාගම විකිණීමට ඇති සිය මූල්‍ය වත්කම්වල ඇගයීමක් සිදු කරයි. අක්‍රිය වෙළඳපොළ නිසා මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන කළ සහ විකිණීමට කළමනාකාරිත්වයෙහි අභිප්‍රාය පූර්වේක්ෂිත අනාගතය තුළ වෙනස් වන කළ, දුර්ලභ අවස්ථානුගත තත්වයන් තුළ සමාගම මෙම මූල්‍ය වත්කම් නැවැත වර්ගීකරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දේවල නිර්වචනයට යෝග්‍ය වන කළ සහ කල්පිරීම දක්වා මෙම වත්කම් පූර්වේක්ෂිත අනාගතය තුළ තබා ගැනීමට අභිලාශය සහ හැකියාව සමාගමට ඇති කල, ණය සහ ලැබිය යුතු දෑ හැටියට නැවත වර්ග කිරීම, සමාගමට එම වත්කම එලෙස තබා ගැනීමට අභිලාශය සහ හැකියාව ඇත්නම් පමණක් සිදු කළ හැක කල් පිරෙන තෙක් රඳවා ගත් කාණ්ඩයට නැවත වර්ගීකරණය කිරීමට අවසර දී ඇත්තේ ඒ අනුව මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ හැකියාව සහ අභිප්‍රාය ආයතනයට ඇති විට පමණි.

විකිණීම සඳහා ප්‍රතිවර්ගීකරණයට භාජන කිරීමෙන් පසු පවතින මූල්‍ය වත්කමක් සඳහා, ස්කන්ධවල හඳුනාගත් එම වත්කමට පෙරාතුව ලැබුණ පාඩුවක් හෝ ලාභයක් වේ නම්, එය සඵල පොළී අනුපාතය භාවිතා කොට ආයොජනයේ ඉතිරි ආයු කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර වෙනස ද, වත්කමෙහි ඉතිරි ආයු කාලය සඳහා සඵල පොළී අනුපාතය උපයෝගී කොට ගෙන ක්‍රමක්ෂය කරනු ලැබේ. අනතුරුව වත්කම අපහරණය වූ බව නිර්ණය වේ නම්, ස්කන්ධවල වාර්තා වූ ප්‍රමාණය ප්‍රතිවර්ගීකරණය කොට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

1.3.6.3 ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් අදාළ වන විට) ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරෙන්නේ,

(a) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට

(b) සංස්ථාව වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය පවරා ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට 'මිල වැඩි කිරීමෙන් වැඩි වූ පිරිවැය හිලව් කිරීමේ' විධිවිධානයක් යටතේ ගෙවීමට බැඳී සිටින විට; එක්කෝ

වත්කමෙහි සියලු අවදානම් ප්‍රතිඵල සහ ප්‍රදානයන් සමාගම විසින් මාරුකර තිබී හෝ වත්කමෙහි සියලු අවදානම් සහ පරිදාන සමාගම පවරා ඇති විට හෝ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සමාගම සාරානුකූලව පවරා හෝ රඳවා ගෙන නොමැති විට යි.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය සමාගම පවරා හෝ 'හරහා ගමන් කිරීමේ' වැඩපිළිවෙලකට එළඹ ඇති විටදී සහ වත්කමේ සියලු අවදානම් සහ පරිදාන සාරනුකූලව පවරා හෝ රඳවා ගෙන හෝ එහි පාලනය පවරා නොමැති විටදී, සමාගම වත්කමේ අඛණ්ඩව සම්බන්ධව සිටින ප්‍රමාණයට වත්කම පිළිගනු ලැබේ.

එහිදී සමාගමද ආශ්‍රිත වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ. සමාගම රඳවා ගෙන සිටින අයිතිවාසිකම් සහ බැඳීම් නිරූපණය වන පදනමකින් පැවැරූ වත්කම සහ සහ ආශ්‍රිත වගකීම මණිනු ලැබේ.

පවරන ලද වත්කම පිළිබඳව ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ සම්බන්ධය, වත්කමේ මුල් ධාරණ වටිනාකමෙන් සහ සමාගම ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම ප්‍රමාණයෙන් වඩා අඩු දෙයට මණිනු ලැබේ.

1.3.6.4 මූල්‍ය වත්කම් අපහායනය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල වී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන්හි (අපහායන සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය හෝ සිද්ධි මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මැනිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි. හානිය පිළිබඳ සාක්ෂි අතරට, ණය ගැතියන් හෝ ණය ගැතියන් කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළු වීමේ සම්භාවිතාව සහ මැනිය හැකි දත්ත ඇති බව යනාදී පෙන්නුම් කිරීම් ඇතුළත් වන අතර හිඟ වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්නුම් කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැය යටතේ සිදුකරන මූල්‍ය වත්කම් සඳහා, සමාගම මුලින් තක්සේරු කරන්නේ, හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි තනි තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා හෝ සාමූහිකව තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා තිබේද යන්නයි. සැලකිය යුතු වුවත් නැතත්, තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සඳහා හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි නොමැති බව සමාගම තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම ඇතුළත් වන අතර ඒවා හානිය සඳහා සාමූහිකව තක්සේරු කරයි. හානිය සඳහා තනි තනිව තක්සේරු කර ඇති සහ හානියක් නැතිවීම හෝ අඛණ්ඩව හඳුනාගෙන ඇති වත්කම්, හානිය පිළිබඳ සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

හානියක් සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් ධාරක අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය (දැනට සිදුව නොමැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු හැර). ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. යම් ණයක විචල්‍ය ණය අනුපාතයක් තිබේනම්, කිසියම් හානි අලාභ මැණිම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් අඩුකරනු ලබන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අඩු කරන ලද ධාරණ අගය මත අඛණ්ඩව පොළී උපචිත වන අතර අපහායන අලාභය මැණීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් උපචය කරනු ලැබේ පොළී ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේදී ආපසු අයකර ගැනීමේ යථාර්තවාදී බලාපොරොත්තුවක් නොමැති විට සහ සියලු ඇප උපලබ්ධි වී ඇති විට හෝ සමාගමට පවරනු ලැබ ඇති විට ණය සහ ආශ්‍රිත දීමනා ලියා හරිනු ලැබේ. පසු වර්ෂයකදී, අපහායනය හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක් නිසා ඇස්තමේන්තුගත අපහායන අලාභයේ ප්‍රමාණය වැඩිවුවහොත් හෝ අඩුවුවහොත්, දීමනා ගිණුම ගැලපීම මගින් කලින් පිළිගත් අපහායන අලාභය වැඩිකරනු හෝ අඩුකරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, එම අයකර ගැනීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සඳහා, ආයෝජනයක් හෝ ආයෝජන කාණ්ඩයක් හානිවී ඇත්දැයි යන්න පිළිබඳව වාස්තවික සාක්ෂි තිබේදැයි ස්ථිරව දැන ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගම ඇගයීමක් සිදු කරයි. ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩුවෙන් සැලකිය යුතු ලෙස හෝ දීර්ඝ කාලීනව අඩුවීම විකිණීම සඳහා ඇති ස්කන්ධ ආයොජන සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂියක් වේ. 'සැලකිය යුතු' යන්න ආයෝජනයේ මුල් පිරිවැයට සාපේක්ෂව අගයනු ලබන අතර, 'දීර්ඝ කාලීනව' යන්න සාධාරණ වටිනාකම එහි මුල් පිරිවැයට පහළින් තිබූ කාලයට සාපේක්ෂව අගයනු ලැබේ. හානිවීම පිළිබඳ සාක්ෂි ඇති විටදී, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගත් එම ආයෝජනයේ යම් අපහායන අලාභ අඩුකොට, අත්කර ගැනීමේ පිරිවැය සහ වත්මන් සාධාරණ වටිනාකම ලෙස මණිනු ලැබූ සමුච්චිත පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායමෙන් ඉවත් කරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලබයි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් කොටස් ආයෝජන සඳහා වන අලාභ පාඩු ආපසු හරවනු නොලැබේ; අපහායනවලින් පසු ඒවායේ සාධාරණ අගය ඉහළ යාම් වෙනත් විස්තීර්ණ අදායම් තුළ ඍජුව හඳුනාගැනේ.

විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කොට ඇති ණය සාධනපත්‍ර ගත් විට, ක්‍රමක්ෂිත පිරිවැයට දක්වනු ලැබූ මූල්‍ය වත්කම් සඳහා යොදාගනු ලැබූ නිර්ණායකම මත පදනම්ව හානි අගයනු ලැබේ. කෙසේවෙතත්, අපහායනය සඳහා වාර්තා කරනු ලැබූ ප්‍රමාණය යනු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කළින් හඳුනාගනු ලැබූ එම ආයෝජනයේ කිසියම් අපහායන අලාභයක් අඩු කොට ක්‍රමක්ෂිත පිරිවැය සහ වත්මන් සාධාරණ අගය අතර වෙනස ලෙස මිණුනු ලැබේ.

අපහායන අලාභය මැනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමේ අඩුකරන ලැබූ ධාරණ වටිනාකම මත පදනම්ව, අනාගත පොළී ආදායම අඛණ්ඩව උපචිත වනු ඇත. පොළී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස සටහන් කරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී, ණය සාධන පත්‍රයක සාධාරණ වටිනාකම වැඩිවුවහොත් සහ එම වැඩිවීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභය හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමකට වාස්තවිකව සම්බන්ධයක් ඇත්තේ නම්, විස්තීරණ ආදායම් ප්‍රකාශය හරහා අපහායන අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

1.3.7 මූල්‍ය වගකීම්

සමාගම සිය මූල්‍ය වගකීම්, උචිත පරිදි, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් ලෙස හෝ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වාර්තාකරණ දිනයට, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් නොතිබුණි.

1.3.7.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

සියලු මූල්‍ය වගකීම් ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලැබේ. ඍජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. සමාගමේ මූල්‍ය වගකීම්වලට ණය සහ ණය ගැනුම්, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් සහ බැංකු අයිරා අයත් වේ.

1.3.7.2 පසු ගණන මිනුම්කරණය

මූල්‍ය වගකීම මැනීම පහත පරිදි වර්ගීකරණය මත රඳා පවතී.

(a) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වගකීම් සහ වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය සහිත මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ. නුදුරු අනාගතයේදී විකිණීම සඳහා අත්පත් කරගත් මූල්‍ය වගකීම් විකිණීමට තබාගත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(b) වෙනත් මූල්‍ය වගකීම්

මූලික පිළිගැනීමෙන් පසුව, අනෙකුත් මූල්‍ය වගකීම් සඵල පොළී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව මනිනු ලැබේ. වගකීම් පිළිගැනීම බැහැර කළ විට මෙන්ම සඵළ පොළී අනුපාත ක්‍රමවේද ක්‍රමක්ෂය ක්‍රියාදාමය හරහා ද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ පිළිගනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

1.3.7.3 ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

වගකීම යටතේ වූ බැඳීම ඉටුකළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත්වූ විට මූල්‍ය වගකීමේ ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. පවතින මූල්‍ය වගකිමක්, සාරානුකූලව වෙනස් කොන්දේසි යටතේ එම ණය දෙන්නාගේම වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය කරනු ලබන විට හෝ පවතින මූල්‍ය වගකීමක් ක්‍රමානුකූලව වෙනස් කරනු ලබන විට, එවැනි හුවමාරු කිරීමක් හෝ වෙනස් කිරීමක් මුල් වගකිම ඉවත් කිරීමක් හා නව වගකිම පිළිගැනීමක් සේ සලකනු ලබන අතර ධාරණ වටිනාකම්වල අදාළ වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

1.3.7.4 මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කෙරෙන්නේ සහ මූල්‍ය තත්ව ප්‍රකාශයේ ශුද්ධ අගයන් වාර්තා කෙරෙන්නේ හඳුනාගත් මුදල හිලව් කිරීමට නෛතිකව බලාත්මක අයිතියක් ඇති විට පමණක් වන අතර ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ වත්කම් හඳුනාගෙන බැරකම් ඒ සමගම නිරවුල් කිරීමට අපේක්ෂා කෙරේ.

1.3.8 තොග

යල්පිනු සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට තොග මනිනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට තොග විකිණිය හැකි මිලය.
තොග ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

අමු ද්‍රව්‍ය	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
නිමි භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවයේ ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය මත තීරණය කළ උචිත සමානුපාතයකට
නොනිමි වැඩ	-	යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැයට
ඇසුරුම් ද්‍රව්‍ය	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
වෙනත් තොග	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
මාර්ගස්ථ භාණ්ඩ	-	සත්‍ය පිරිවැයට

1.3.9 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

අනෙකුත් ලැබිය යුතු දෑ, අපහායනය සඳහා වන ප්‍රතිපාදන අඩු කොට ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ට හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදන ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. කෙසේවුවද, සමාගමට අදාළ නොවැළැක්විය හැකි හේතු නිසා කාර්යමණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන්නේ නැත.

1.3.10 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන දේ වලට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස රඳවාගෙන ඇති තැන්පතු, මුලින් මාස තුනක කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ. බැංකු අයිරා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් තුළ පෙන්නුම් කරනු ලැබේ.

1.3.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

(a) වර්ගීකරණය

මුදල් හෝ අනෙකුත් වත්කම් පැවරීමට බැඳීමක් නොමැති විටදී අභිමතානුසාරී ලාභාංශ සහිත සාමාන්‍ය කොටස් ස්කන්ධ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(b) ලාභාංශ

ලාභාංශ ලැබීමට කොටස් හිමියන්ගේ අයිතිය ස්ථාපිත කළ විටදී, ලාභාංශ පිළිගනු ලැබේ. ස්කන්ධ කොටස් හිමියන්ගේ අතුරු ලාභාංශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබේ. අවසාන ලාභාංශ ගෙවනු ලබනුයේ කොටස් හිමියන් විසින් වාර්ෂික මහා සම්මේලනයේදී අනුමත කරනු ලැබූ විටදීය.

1.3.12 ජංගම සහ විලම්භිත ආදායම් බදු

a) ජංගම බදු

වත්මන් සහ පූර්ව කාල සීමා සඳහා ජංගම ආදායම් බදු වත්කම් සහ බැරකම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණය මනිනු ලැබේ.

ආදායම් බදු සඳහා වන විධිවිධානය පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සහ 2006 අංක 10 දරන් දේශීය ආදායම් පනතේ විධි විධාන අනුව ගණනය කළ ආදායම් සහ වියදම් සංරචකයන් මතයි.

b) විලම්භිත බදුකරණය

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්භිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් පිළිගනු ලැබේ. සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම ප්‍රයෝජනයට ගත හැකි බදු අයකළ හැකි ලාභයක් තිබීමේ හැකියාව ඇති ප්‍රමාණයට සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ.

විලම්භිත බදුවල ධාරණ ප්‍රමාණය එක් එක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්භිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉඩ දීම පිණිස බදු අයකළ හැකි ප්‍රමාණවත් ලාභයක් පැවැතීම තවදුරටත් සම්භාවී නොවන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සෑම දිනයකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය මඟින් විලම්භිත බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩ සැලසෙන තරමට හඳුනාගෙන ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පනවා ඇති හෝ පැනවීමට නියමිත බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව, වත්කම උපලබ්ධි වූ හෝ බැරකම පියවනු ලැබූ වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

ස්කන්ධ වශයෙන් සෘජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ආදායම් බද්ද කොටස් වශයෙන් හඳුනාගෙන ඇත.

ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහා බදු අධිකාරීන් විසින්ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

1.3.13 සේවක ප්‍රතිලාභ

(a) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

LKAS 19 / 1983 අංක 12 දරන පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධි විධාන සලසා ඇත. වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. සිදුකරන ලද ආයුගණක ඇගයීම මත පාරිතෝෂික බැරකම් පදනම් වේ. ආයුගණක ලාභ හෝ අලාභ ඒවා මතුවූ කාල සීමාවෙහි වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට වැය

උපකල්පන පිළිබඳ විස්තර 16 වන සටහනෙහි දැක්වේ. භාවිතා කළ ප්‍රධාන බරක් වනු ඇත නැතහොත් බැර කරනු ඇත.

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික (ඉදිරියට...)

සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම ඇක්චූරියල් ඇන්ඩ මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පුද්) සමාගම විසින් සිදුකළ ආයුගණක ඇගයීම් මත පදනම් වේ. ආයුගණක ඇගයීම, වට්ටම් අනුපාත සහ අනාගත වැටුප්

වර්ධක පිළිබඳ උපකල්පන සිදුකිරීම හා සම්බන්ධ වේ. තක්සේරුකරණයේ සංකීර්ණත්වය, පවතින උපකල්පන සහ එහි දිගුකාලීන ස්වභාවය, අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමක් මෙම උපකල්පනවල වෙනස්කම් වලට බෙහෙවින් සංවේදී වේ. සියලු උපකල්පන එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. ඇගයීමේදී භාවිතා කළ ප්‍රධාන උපකල්පන වනුයේ මරණ අනුපාතය, දුබලතා අනුපාත සහ ආපසු ගැනීමේ අනුපාතයි. අවසන් වැටුප් විශ්‍රාම යෝජනා ක්‍රමයක් සඳහා ප්‍රතිපාදන සැලසීමේ වේගය නිර්ණය කිරීමේදී වට්ටම් අනුපාතය සහ වැටුප් අනුපාත පිළිබඳ උපකල්පන තීරණාත්මකව වැදගත් වේ.

(b) නිශ්චිත දායක සැලසුම- සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. සමාගම සේවකයන්ගේ දළ වේතනවලින් 12% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා අනුපිළිවෙලින් දායක කරයි.

1.3.14 ප්‍රදාන සහ සහනාධාර

ක්‍රමානුකූල පදනමක් මත වන්දි ගෙවීමට අදහස් කරන අදාළ පිරිවැය හා සැසඳීමට අවශ්‍ය කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රදාන සහ සහනාධාර බැර කරනු ලැබේ.

සාධාරණ අගයට කෙරෙන මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළු වත්කම් වලට අදාළ ප්‍රදානයන්, විලම්භිත ආදායම ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කර ඇති අතර වත්කමේ ඵලදායී ආයුකාලය මත ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

අදායමට අදාළ ප්‍රදානයන්, ඒවා ලැබුණු කාල සීමාව අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

1.3.15 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලිය තුළ සැපයුම්කරුවන්ගෙන් ලබාගත් සේවාවන්ට ගෙවිය යුතු මුදලයි. වසරක් තුළ හෝ ඊට අඩුවෙන් ගෙවීමට ඇති විට ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අතර එසේ නැතහොත් ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ. වට්ටම් කිරීමේ බලපෑම නොවැදගත් බැවින් ප්‍රකාශිත පොළී අනුපාතයක් රහිත කෙටි කාලීන ගෙවිය යුතු දෑ ආරම්භක ඉන්වොයිසි කළ ප්‍රමාණයට මනිනු ලැබේ.

1.3.16 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික සහ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු නොලැබේ.
එක හා සමාන බැඳීම් කිහිපයක් ඇතිවිටදී, බැඳීම් පංතිය සමස්තයක් ලෙස සලකා බැලීම මගින්, ඒවා පියවීම සඳහා මුදල් ගලායාමක් අවශ්‍ය කරනු ලැබීම පිළිබඳ භව්‍යතාව නිර්ණය කරනු ලැබේ. සමාන බැඳීම් පංතියක ඇතුලත් කොට ඇති කවර හෝ එක් අයිතමයකට අදාළ මුදල් ගලා යාමේ භව්‍යතාව සුළු වුවත් ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

1.3.17 බැඳීම්

වාර්තාකරණ දිනය වන විට පැවැති සියලු ද්‍රව්‍යමය බැඳීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශ සටහන්වල හෙළිදරව් කර ඇත.

1.3.18 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

වෙනත් පාර්ශවයක මූල්‍ය හෝ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීමට හෝ සැලකිය යුතු බලපෑමක් කිරීමට එක් පාර්ශවයකට හැකියාවක් ඇති විටදී, මිලක් ගෙවන්නේද නැද්ද යන්න නොසළකා, ගනුදෙනුවට

අදාළ අනාවරණයන් කරනු ලැබේ. මව් සමාගම සහ පරිපාලිත සමාගම් අතර ගනුදෙනුවක් සිදුවූයේද නැද්ද යන්න නොතකා එම ආශ්‍රිත පාර්ශව අතර සබඳතාවය අනාවරණය කළ යුතුය.

1.3.19 ආදායම හඳුනාගැනීම

සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලදී සපයන ලද සේවා සඳහා ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයේ සාධාරණ වටිනාකමින් ආදායම් සමන්විත වේ. තැරැව්කාර ගාස්තු, විකුණුම් වියදම් සහ පිරිවැටුමට අදාළ අනෙකුත් බදු අඩුකොට ඉන්වොයිස් කරන ලද වටිනාකමට ආදායම වාර්තා කරනු ලැබේ.

(a) භාණ්ඩ අලෙවිය

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති ලැබිය යුතු ගෙවීම ගැන විශ්වාසය තැබිය හැකි සහ ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ එවීමේ ඉඩ පිළිගත හැකි මට්ටමට මැනිය හැකි විටදී ආදායම හඳුනාගනු ලැබේ.

(b) පොළී ආදායම

සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(c) ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

(d) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි.

1.3.20 වියදම්

වියදම් හඳුනාගැනෙන්නේ උපචිත පදනමිනි. ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්වයකින් පවත්වාගෙන යාම පිණිස දරන ලද සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

විස්තීරණ ආදායම් ප්‍රකාශ තොරතුරු ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් වර්ගීකරණය පිණිස වියදමේ ක්‍රියාකාරීත්ව ක්‍රමවේදය යොදා ගෙන ඇත.

2. නිකුත් කරන ලද එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කර ඇති එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති සහ අර්ථ නිරූපණ පහත හෙළිදරව් කොට ඇත. ඒවා බලාත්මක වූ විටදී, අදාළ කරගත යුතු වන්නේ නම්, එම ප්‍රමිති යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

i) SLFRS 9 - මූල්‍ය උපකාරක:

SLFRS 9 මගින් LKAS 39 ප්‍රතිස්ථාපනය කරන අතර වර්ගීකරණය සහ මැණීම, හානිය සහ මූල්‍ය වත්කම් සහ සහ වගකීම් හානිය සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය හා අදාළ වේ.

SLFRS 9 පහත දැක්වෙන දෑ වෙනස් කරනු ඇත:

- - ලාභ හා පාඩු හරහා සාධාරණ වටිනාකමට මණිනු නොලබන සියලු මූල්‍ය වත්කම් සඳහා නව අපහායන අවශ්‍යතා
- - මූල්‍ය වත්කම් සඳහා පූර්වයෙන් අවසානයකට ගෙන එන ලද වර්ගීකරණ සහ මැණීම් අවශ්‍යතාවල සංශෝධන

SLFRS 9 යටතේ, ණය සිදුවීමක් තව දුරටත් ණය අලාභ පිළිගැනීමට පෙර සිදුවීම අවශ්‍ය නොවන බැවින් අපහායන ආදර්ශය වඩා 'ඉදිරි දැක්මක්' සහිත ආදර්ශයක් වේ. අනෙකුත් විස්තීරණ ආදායම

හරහා ක්‍රමක්ෂිත පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට (FVTOCI) මණිනු ලබන මූල්‍ය වත්කම් සඳහා අස්තිත්වයක් දැන් සැමවිටම (අවම වශයෙන්) මාස 12 ක් සඳහා අපේක්ෂිත ලාභ හෝ අලාභ හඳුනාගනු ඇත. මූලික පිළිගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් පවතින විටදී මෙම වත්කම් මත ආයු කාලය පුරා අපේක්ෂිත අලාභ හඳුනාගනු ඇත.

අනෙකුත් වෙනස්කම්වලදී, SLFRS 9 හුදෙක්ම මුල් ණය මුදල සහ පොලිය ගෙවීම සඳහා වන ගෙවීම් ඇති කරන්නා සේ සලකනු ලබන මූල්‍ය වත්කමක ගිවිසුම්කර මුදල් ප්‍රවාහ සඳහා අවශ්‍යතා පැහැදිළි කරන් අතිරේක යෙදුම් මාර්ගෝපදේශ ද හඳුන්වා දෙයි.

අනෙකුත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගය ලෙස ණය සාධනපත්‍ර සඳහා තෙවන මැණීම් කාණ්ඩයක් ද එකතු කරනු ලැබ තිබේ, එය FVTOCI ය.- SPPI ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂාව සපුරන ණය උපකරණවලට අදාළ වන සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මෙන්ම මූල්‍ය වත්කම් විකිණීමට අස්ථිත්වය ණය උපකරණ දරන විට එය අදාළ වේ.

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය කාල සීමාව සඳහා බල පවත්වනු ඇත.

SLFRS 9 මුල්වරට යොදාගැනීම, මූල්‍ය සාධනපත්‍ර සඳහා වන ගිණුම්කරණය මත පුළුල් සහ විභව්‍ය ඉතා වැදගත් බලපෑමක් ඇති කරනු ඇත. ණය සහ අත්තිකාරම්, ලැබිය යුතු කල්බදු කුලී, කුලී පිට ගැණුම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මණිනු නොලබන අනෙකුත් මූල්‍ය සාධන පත්‍ර සඳහා නව අපහායන අවශ්‍යතා සැලකිය යුතු වෙනස්කම් ඇති කරනු ඇත.

මෙම ප්‍රමිතියේ බලපෑම පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සමාගම මෙතෙක් සිදුකර නොමැත.

ii) SLFRS 15- පාරිභෝගිකයින් සමග ගිවිසුම් වෙතින් ආදායම

පාරිභෝගිකයන් හට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පැවැරීම නිරූපණය වීම පිණිස එම භාණ්ඩ සහ සේවා හුවමාරුව සඳහා අස්තිත්වය හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිඵලය පිළිබිඹු වන ප්‍රමාණයකට අස්තිත්වයක් ආදායම පිළිගනු ඇත. මින් අදහස් වනුයේ 'LKAS 18' ආදායම යටතේ වත්මනෙහි පවතින ආකාරයට අවදානම් සහ පරිදාන පවරනවාට වඩා භාණ්ඩ හෝ සේවා පාලනය පවරනු ලැබූ විටදී ආදායම පිළිගන්නා බවයි.
මෙය සාක්ෂාත් කරගැනීම සඳහා, SLFRS 15 පියවර පහේ ආදර්ශය යොදා ගැනීම අවශ්‍ය කෙරේ.

1. ගිවිසුම හඳුනාගැනීම
2. කාර්යසාධන බැඳීම් හඳුනාගැනීම
3. ගනුදෙනු මිල නිර්ණය කිරීම
4. එක් එක් කාර්යසාධන බැඳීම සඳහා ගනුදෙනු මිලක් වෙන් කිරීම
5. එක් එක් කාර්යසාධන බැඳීම සපුරාලනු ලැබූ විටදී ආදායම පිළිගැනීම

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය කාල සීමාව සඳහා බල පවත්වනු ඇත.

මෙම ප්‍රමිතියේ බලපෑම පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සමාගම මෙතෙක් සිදුකර නොමැත.

iii) පහත දැක්වෙන නව ගිණුම්කරණ ප්‍රමිති සහ පවතින ප්‍රමිති සඳහා සංශෝධන මූල්‍ය ප්‍රකාශ මත බලපෑමක් කරනු ඇතැයි අපේක්ෂා නොකරයි.

